**වර්ෂ 2022 ක් වූ ඔක්තෝබර් මස 20 වන දින පෙ.ව 10.00 ට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ වාර්තාව**

පැමිණීම

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා |
| 02. ගරු උප සභාපති | - | එච්.ඒ නන්දසෝම මහතා |
| 03. ගරු මන්ත්‍රී | - | ශාන්තලාල් පෙරේරා මහතා |
| 04. ගරු මන්ත්‍රී | - | ටී.ඒ.ඩී.සී දමයන්ති මිය |
| 05. ගරු මන්ත්‍රී | - | එස්.එල්.අරුණ ශාන්ත මහතා |
| 06. ගරු මන්ත්‍රී | - | අයි.රාමකිලි මහතා |
| 07. ගරු මන්ත්‍රී | - | ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා |
| 08. ගරු මන්ත්‍රී | - | කේ.ඕ කුසුම්ලතා මිය |
| 09. ගරු මන්ත්‍රී | - | එන්.එම් සුසිලා දමයන්ති මිය |
| 10. ගරු මන්ත්‍රී | - | එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා |
| 11. ගරු මන්ත්‍රී | - | වී.මුරලිදරන් මහතා |
| 12. ගරු මන්ත්‍රී | - | පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි |
| 13. ගරු මන්ත්‍රී | - | එච්.ජී මහින්ද ගුණසේකර මහතා |
| 14. ගරු මන්ත්‍රී | - | කේ.ඕ සෝමතිලක මහතා |
| 15. ගරු මන්ත්‍රී | - | එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා |
| 16. ගරු මන්ත්‍රී | - | ජී.කේ.පී ෆොන්සේකා මිය |

නොපැමිණීම

| | | |
|---|---|---|
| 01. ගරු මන්ත්‍රී | - | ජී.එස්.ඒ ෆොන්සේකා මහතා |
| 02. ගරු මන්ත්‍රී | - | එච්.ජී මෛත්‍රීපාල මහතා |
| 03. ගරු මන්ත්‍රී | - | එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය |
| 04. ගරු මන්ත්‍රී | - | එච්.ඒ.එන්.සී රණසිංහ මහතා |

**01. පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරිම**

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය

පසුගිය සභා වාර්තාවේ ගලබඩ දිය ඇල්ල ගැන අපි කථා කරනකොට අපි කියපු තොරතුරු කිසිම දෙයක් සඳහන් වෙලා නෑ. මම කියපු කිසිම දෙයක් සඳහන් වෙලා නෑ. අර මම කියපු කිසිම දෙයක් වාර්තාවට ඇවිල්ලා නෑ. ඒ නිසා ඒක සංශෝධනය වෙන්න ඕනි කියලා මම කියනවා.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන සහිතව 2022 ඔක්තෝබර් මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව 2022 ඔක්තෝබර් මස මහා සභා වාර්තාව පෙන්වා දෙන ලද සංශෝධනය සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන**

02 - 01 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

ගලබොඩ වතුයායේ කෘෂි නවීකරණ ව්‍යාපෘතිය යටතේ සැලසුම් කළ වගාවන් සඳහා ළඟාවිය හැකි මාර්ග නවීකරණය කිරීම - දෙවන අදියර යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 02 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

ජනතා හිතවාදී කාර්යක්ෂම සේවාවක් වෙනුවෙන් මහජන සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 03 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

මධ්‍යම පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකයේ කළමනාකරණ කමිටුව - 2021 (1) කළමනාකරණ පත්‍රිකා අංක CPC/ECD/MgCd/22(1)-05 යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 04 පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය

2022.07.21 දින පවත්වන ලද මහා සභා රැස්වීම් වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 05 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>
ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ පළාත් පාලන විෂය භාර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 06 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>
සභා අරමුදල් වියදම් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 07 පළාත් අධ්‍යක්ෂ (ම.ප.) මාර්ග සංවර්ධන අධිකාරිය</u>
Project – ADB Funded Integrated Road Investment Program (1-Road) Rehabilitation / Improvement and Maintenance of Rural Roads in Central Province.
Contract No – RDA/ADB/iROAD(CP)NCB/CP-RR(KA-02)
Subject – Handing over of the road – Dekinda Weralugolla Road (ID-20) යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 08 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>
ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 – 09 විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය</u>
ව්‍යාපෘතිය - රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශයේ රට හදන සෞභාග්‍යයේ දැක්ම යටතේ ජාතික, ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් කි. මී. 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීම
විෂය - සංවර්ධනය නොකරන ලද මාර්ග අදාල ආයතන වෙත පවරා දීම (වරකාව ගම මැද මාර්ගය) යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 – 10 විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය</u>
විෂය - සංවර්ධනය නොකරන ලද මාර්ග අදාල ආයතන වෙත පවරා දීම (පල්ලේගම රවුම් මාර්ගය) යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 – 11 විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය</u>
කළුගල් ව්‍යාපෘතිය හේතුවෙන් මාර්ගයට හා එහි කාණු පද්ධතියට වන හානිය සම්බන්ධව - ග්‍රීන්වුඩ් ගල්වල යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 12ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය</u>
ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම, ඩී. එම්. නිදූකා ප්‍රියදර්ශනී මහත්මියගේ දියණිය වන ඩබ්. ජී. චාමලී රශ්මිකා දියණිය සඳහා ක්‍රීඩා උපකරණ ලබා දීම වෙනුවෙන් සභා අරමුදලින් රු. 25,910.00 ක මුදලක් සභා අරමුදලින් වියදම් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 – 13පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>
ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ පළාත් පාලන ගරු විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 – 14 ප්‍රාදේශීය ලේකම්, පස්බාගේ කෝරළේ</u>
බච්චාගම වසමේ කිතුල් කොටේ පාලම ආශ්‍රිතව අපද්‍රව්‍ය බැහැර කිරීම වළක්වා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 – 15අධ්‍යක්ෂ, මධ්‍යම පරිසර අධිකාරිය</u>
Proposed Durian Cultivation Project at Nagasthenna Estate, Yatiyantota යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 – 16 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>
ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ පළාත් පාලන ගරු විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 – 17 ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය</u>

ජනතා හිතවාදී කාර්යක්ෂම සේවාවක් වෙනුවෙන් මහජන සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**03. මහජන පෙත්සම්,පැමිණිලි හා ලිපි සභාගත කිරීම**

03 – 01 C. B. ඉලංගවත්ත, 38/9, කඩියන්ලෙන ජනපදය, කැටබූලාව

ජනපදය හරහා වැටී ඇති ඇළ මාර්ගය සම්බන්ධව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

03 – 02 M. Kalil Gaffor , No. 52, Kadiyenlena Bazaar, Kataboola

කඩියන්ලෙන නගරයට ඉන්ධන පිරවුම්හලක් හා ඉරිදා පොළ පැවැත්වීමට GI පයිප්ප යොදා හට් එකක් සකසා දෙන ලෙස ඉල්ලීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

03–03D. A. සමරනායක, අංක 121, හයින්ෆෝඩ් "බී", වැලිගම්පල, නාවලපිටිය

සුසාන භූමියක් ඉල්ලා සිටීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

03 – 04 කෝපියාවත්ත මුල්ල ජනපදය ගම්වාසීන්

කෝපියාවත්ත මුල්ල ජනපදයට ගමන් ගන්නා මාර්ගය පිළිසකර කර ගැනීම සඳහා යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

05 - 01 ගරු මන්ත්‍රී කේ.ඕ. සෝමතිලක මහතා

මීපිටිය සුසාන භූමියෙහි මැනුම් කටයුතු සිදු කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 02 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්වල සුසාන භූමි ක්‍රීඩා පිටි විශාල ප්‍රමාණයක් පිහිටා ඇත. එම සියළු ඉඩම් ප්‍රාදේශීය සභාව වෙත නීත්‍යානුකූලව පැවරීමට මේ වන විට කටයුතු ආරම්භ කර ඇත. එහි පළමුවන පියවර ලෙස අදාල ඉඩම් කොටස් මැණුම් කර පිඹුරුපත් සකස් කළ යුතුව ඇති අතර. අදාල ඉඩම් මැනීම සඳහා පහත පරිදි මැණුම් නියෝග ලැබී ඇත. එම මැනීම සඳහා පළමුව ගාස්තු ගෙවිය යුතු බැවින් අදාල මැණුම් ගාස්තු සභාව මඟින් ගෙවීම සුදුසු බවටත් අදාල මැනුම් ගාස්තු සභාව මඟින් ගෙවීමට කැමැත්ත ප්‍රකාශ කර ලිපියක් යැවීම සුදුසු බවටත් මම යෝජනා කරමි.

1) ටිල්ටන් වත්ත — සුසාන භූමිය (පල්ලේගම)
2) කඩියන්ලෙන වත්ත — සුසාන භූමිය (කඩියන්ලෙන)
3) මොන්ටික්‍රිස්ටෝ වත්ත — සුසාන භූමිය (සෝලංකන්ද)
4) මස්කිනා වත්ත — සුසාන භූමිය (ඉඟුරුඔය)
5) හයින්පෝඩ් වත්ත — සුසාන භූමිය (හයින්පෝඩ්)
6) ඉඹුල්පිටිය වත්ත — සුසාන භූමිය (බව්වාගම)
7) ටිල්ටන් වත්ත — සුසාන භූමිය (වරකාව)

ගරු මන්ත්‍රී කේ.ඕ සෝමතිලක මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 03 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

පළාත් පාලන කොමසාරිස්, මධ්‍යම පළාත් ප්‍රාග්ධන වත්කම් නඩත්තු සැලැස්ම - 2022 ලිපියට අනුව පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභා කාර්යාල ගොඩනැඟිල්ලෙහි තීන්ත ආලේප කිරීම සඳහා රු. 400,000.00 ක් වෙන් කර ඇත. එම කර්මාන්තය නිම කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී කේ.ඕ සෝමතිලක මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 04 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභා කාර්යාල ගොඩනැඟිල්ලෙහි තීන්ත ආලේප කිරීම සඳහා රු. 400,000.00 ක් වෙන් කර ඇත. ඒ සඳහා සකස් කරන ලද තාක්ෂණ නිලධාරි ඇස්තමේන්තුව රු. 767,320.19 කි. එබැවින් මෙම කර්මාන්තය සඳහා වෙන් ව ඇති රු. 400,000.00 මඟින් අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගෙන සභාවේ සේවයේ නියුතු පුහුණු ශ්‍රමිකයන් එම කාර්යය සඳහා යොදවා කර්මාන්තය නිම කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 05 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත නම් කරන ලද භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.
භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය

1. සුදර්ශනී කුමාරි මෙය - කළමනාකරණ සේවා නිලධාරි, අඹගමුව ප්‍රා. ස. (භා. ස. මණ්ඩලයේ සභාපති)
2. දිල්මිණී යෝගේෂ්වරන් මිය - කළමනාකරණ සේවා නිලධාරි (සාමාජික)
3. රුවනි චන්දිමා මිය - සංවර්ධන නිලධාරි (සාමාජික)
4. නදීකා තරංගනී මිය - සංවර්ධන නිලධාරි (සාමාජික)

පුස්තකාල පොත් සමීක්ෂණ මණ්ඩලය

1. ලාල් හේරත් මයා - ප්‍රජා සංවර්ධන නිලධාරි (පුස්තකාල පොත් සමීක්ෂණ මණ්ඩලයේ සභාපති)
2. ඊ. ජී. ශ්‍රියාලතා මිය - කළමනාකරණ සේවා නිලධාරි (සාමාජික)
3. එස්. ජේ. පියුමිකා මිය - සංවර්ධන නිලධාරි (සාමාජික)

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 06 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ණය ගැති හා ණය හිමි ලේඛනවලින් ඉවත් කිරීම සම්බන්ධව 2018 කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ අප සභාව මඟින් ක්‍රියාත්මක වූ කඩියන්ලෙන මෙම්මලේ පාර කොන්ක්‍රීට් කිරීම සඳහා 2018 දෙසැම්බර් මස බිල්පත ඉදිරිපත් කර ඇත. එම කර්මාන්ත සඳහා අමාත්‍යාංශයේ කාර්මික නිලධාරිගේ ක්ෂේත්‍ර කටයුතුවලින් පසු අමාත්‍යාංශ මඟින් සිවිල් වැඩ ඇතුළත් සම්පූර්ණ මුදල වන රු. 924,326.77 අප වෙත ලැබී ඇත. ඒ අනුව ඉහත සඳහන් කර්මාන්තය සඳහා අමාත්‍යාංශයෙන් සම්පූර්ණ මුදල ලැබී ඇති බැවින් අපගේ ණයගැති ලෙස පෙන්වා ඇති රු. 10,270.00 ක මුදල නොලැබෙන බැවින් ණය ගැති හා ණය හිමි ශේෂවලින් කපා හැරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී කේ.ඕ සෝමතිලක මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහාඅනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 07 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
සංවර්ධන කාර්යයන් සඳහා අයවැය ලේඛනයෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන යටතේ රු. 100,000.00 ක මුදලක් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී. මුරලිදරන් මයා විසින් ග්ලිස්ටන් ග්‍රාම සංවර්ධන සමිතියට හා විග්ටන්වත්ත කෝවිලට වැසි ආවරණ කට්ටල දෙකක් ලබා දීමට කරන ලද ඉල්ලීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත. 2021 වර්ෂයේ මිල ගණන් කැඳවා කටුබැද්ද ටෙන්ට් මාස්ටර් වෙතින් මිලදී ගැනීමට අනුමත වී ඇත. එවකට රටේ පැවති කොරෝනා රෝග ව්‍යාප්තිය හේතුවෙන් හා ඉන්පසු ඇති වූ ඉන්ධන අර්බුදය හා භාණ්ඩවල පැවති හිඟතාවය මත මිලදී ගැනීම් ප්‍රමාද වී ඇත. නැවත මේ සඳහා මිල ගණන් කැඳවා ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර, නව මිල ගණන් යටතේ මිලදී ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 08 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සඳහා 2023 වර්ෂයේ ද්‍රව්‍ය සැපයීමට හා සේවාවන් ඉටු කිරීම සඳහා ලියාපදිංචි වීමට කැමති සුදුසු සැපයුම්කරුවන්ගෙන්, කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ සැලසුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවීමට අදාලව පහත සඳහන් ගාස්තු අය කිරීමටත් ඒ සඳහා වන පුවත්පත් දැන්වීම සිංහල හා දමිළ භාෂා දෙකෙන් දිනමිණ හා තිනකරන් පුවත්පත්වල පල කිරීමසුදුසු බවටත් මම යෝජනා කරමි.

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**
**රඹුක්පිටිය, නාවලපිටිය**

පහත සඳහන් ද්‍රව්‍ය සැපයීමට හා සේවාවන් ඉටු කිරීම සඳහා ලියාපදිංචි වීමට කැමති සුදුසු සැපයුම්කරුවන්ගෙන්, කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ සැලසුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. එක් එක් විෂය සඳහා පහත සඳහන් ලියාපදිංචි ගාස්තුවක් සමඟ අයදුම්පත්‍රය පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභාව, රඹුක්පිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**ලියාපදිංචි කිරීමේ අවසාන දිනය 2023.01.31වේ.**
**ලියාපදිංචි කිරීමේ ගාස්තු**

| 01.ද්‍රව්‍ය සැපයීම. | | ගාස්තුව |
|---|---|---|
| I. | සියලුම වර්ග වල ලිපි ද්‍රව්‍ය | 1500.00 |
| II. | කාර්යාල උපකරණ | 2000.00 |
| III. | ලී බඩු හා වානේ උපකරණ | 2000.00 |
| IV. | සියලුම වර්ගයේ විදුලි උපකරණ | 1500.00 |
| V. | සෞඛ්‍ය උපකරණ හා විෂබීජ නාශක | 1000.00 |
| VI. | මුද්‍රණ කටයුතු හා ඡයාරූප කටයුතු | 2000.00 |
| VII. | රථ වාහන හා සත්ත්ව බලපත්‍ර අංක තහඩු | 500.00 |
| VIII. | ගොඩනැගිලි ද්‍රව්‍ය (කළුගල්,වැලි,හුණු) | 2000.00 |
| IX. | රථ වාහන අමතර කොටස් | 2000.00 |
| X. | ජලනළ හා උපාංග | 2000.00 |
| XI. | කොන්ක්‍රීට් ආශ්‍රිත භාණ්ඩ සැපයීම | 1000.00 |
| XII. | ටයර් ,ටියුබ් හා බැටරි | 2000.00 |
| XIII. | රෙදිපිළි සහ නිල ඇඳුම් සැපයීම | 2000.00 |
| XIV. | යතුරු ලියනය අනු පිටපත් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස්යන්ත්‍රයහාඋපාංගසැපයීම | 2000.00 |
| XV. | වැහි කබා /ගම් බූට්ස්/සපත්තු මේස් | 1500.00 |
| XVI. | දැව සැපයීම(ලෑලි, පරාල, රිප්ප) | 1500.00 |
| XVII. | පැළ වර්ග, පොහොර වර්ග, තෙල් ඇතුළු උද්‍යාන අලංකරණය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම | 1000.00 |
| XVIII. | රබර් මුද්‍රා හා ප්ලාස්ටික් උපකරණ සැපයීම | 1000.00 |
| XIX. | රාජකාරි නිල හැඳුනුම්පත් සැපයීම | 1000.00 |
| XX. | පෙර පාසල් උපකරණ හා ළමා උද්‍යාන උපකරණ සැපයීම | 1000.00 |

| 02. සේවා සැපයීම | | ගාස්තුව |
|---|---|---|
| I. | ආහාර පාන සැපයීම | 1500.00 |
| II. | ප්‍රවාහන ගාස්තු | 1500.00 |
| III. | වාහන හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව | 3000.00 |
| IV. | වාහන සේවා කිරීම | 3000.00 |
| V. | කාර්යාල උපකරණ අලුත්වැඩියා කිරීම | 1500.00 |
| VI. | මිනුම් කටයුතු | 3000.00 |
| VII. | වාත්තු කිරීම | 2000.00 |
| VIII. | වාහන සීට් කවර සැකසීම හා කුෂන් කිරීම | 1500.00 |

වැඩි විස්තර සඳහා කාර්යාල වේලාවන් තුළ 054-4922922 හෝ 054-4929024 දුරකථනයෙන් ලබාගත හැක.

**03. කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.**
කොන්ත්‍රාත්කරුවෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා මෙම කාර්යාලයෙන් ලබා ගන්නා ලද, අයදුම්පත්‍රයක් සම්පූර්ණ කළ යුතු අතර, ඔබගේ අයදුම්පත හා වත්කම් සහතික ඉදිරිපත් කළ යුතුය.
කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව 2000.00

**04. සැලසුම්කරුවන් ලියාපදිංචි කිරීම.**
ලියාපදිංචි කිරීමේ ගාස්තු 4000.00
අයදුම්පත්‍ර ගාස්තුව 200.00

**05. කොන්දේසි**

I. ඉහත සඳහන් එක් එක් සැපයුම් හා සේවාවන් සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය
II. ලියාපදිංචි වන අයදුම්කරුවන්ගෙන් සාමාන්‍යයෙන් මිල ගණන් කැඳවනු ලබන අතර, ඔවුනොවුන් ඉදිරිපත් කරන මිල ගණන් අඩු වශයෙන් මාස 03ක කාලයක් තුළ වෙනස් නොකර,ස්ථාවර තත්ත්වයක තබා ගත යුතුය.
III. අවශ්‍ය යැයි හැඟෙන අවස්ථා වලදී වෙනත් සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ ලබා ගැනීමේ අයිතිය සභාව සතුය.ඉල්ලුම් කළ විට භාණ්ඩ මිල ගණන් ඉදිරිපත් නොකරන්නා වූද, නියමිත ප්‍රමිතීන්ට හා ගුණාත්මක භාවයට අනුකූල නොවන්නා වූ ද, සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ.
IV. මිලදී ගැනීම සිදු කිරීම් සභාවේ අභිමතය පරිදි සිදු කරනු ලබන අතර, බිල්පත් ගෙවීම චෙක්පත් මගින් දින 45 ක් ඇතුළත සිදු කරනු ලැබේ.

2022.10.20.
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව
රඹුක්පිටිය.

ඕ.ජී.රෝහණ බණ්ඩාර
සභාපති, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව
රඹුක්පිටිය.

ගරු මන්ත්‍රීටී.ඒ.ඩී.සී දමයන්ති මිය
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 – 09 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා තැන්පත් ලේඛනයේ තැන්පතු ලෙස ගිණුම්ගත කොට ඇති තැන්පතු ආපසු නොගැනීම හේතුවෙන් සභාවේ ආදායමට ගැනීමට අපේක්ෂා කරන අතර පහත සඳහන් තැන්පතු පිළිබඳ සලකා බලා එම තැන්පතු මුදල් සභාවේ ආදායමට ගැනීමසුදුසු බවට මම යෝජනා කරමි.

| අනුඅංකය | නම | විස්තරය | තැන්පතු මුදල |
|---|---|---|---|
| **2015 වර්ෂය** | | | |
| 1 | පළාත් පාලනදෙපාර්තමේන්තුව | ඉඟුරුඔය නව ගම්මාන පාර පරිපාලන වියදම් | 9,845.50 |
| 2 | පළාත් පාලනදෙපාර්තමේන්තුව | වෙස්ට්හෝල් ක්‍රීඩා පිටිය සංවර්ධනය පරිපාලන වියදම් | 12,054.15 |
| 3 | පළාත් පාලනදෙපාර්තමේන්තුව | වෙස්ට්හෝල් ක්‍රීඩා පිටිය සංවර්ධනය පරිපාලන වියදම් | 18,862.73 |
| 4 | අධ්‍යක්ෂක , ක්‍රීඩාපිටි සංවර්ධන දෙපාර්තමේන්තුව | රඹුක්පිටිය සිල්වාස්ලෑන්ඩ් ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම (පරිපාලනවියදම්) | 174,596.33 |
| 5 | සභාපති, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව | ගරු මන්ත්‍රී අසංග ප්‍රභාත් වෙනුවෙන් ගෙන්වාගත් මුදල තැන්පත් කිරීම | 11,000.00 |
| 6 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2014 සංවර්ධන කටයුතු සඳහා පරිපාලන වියදම් | 200,000.00 |
| 7 | මාපාකන්ද දකුණ ග්‍රාම සංවර්ධන සමිතිය | මාපාකන්ද ක්‍රීඩා පිටිය සංවර්ධනය පරිපාලන වියදම් | 7,993.44 |
| | | | **434,352.15** |

| | | | |
|---|---|---|---|
| **2016 වර්ෂය** | | | |
| 1 | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය | පෙරටු කාර්යාල සැකසීම | 70.00 |
| 2 | දයාරත්න බණ්ඩාර | ජල ගාස්තු වැඩිපුර අයකර ගැනීම | 50.00 |
| | | | **120.00** |
| **2019 වර්ෂය** | | | |
| 1 | බව්වාගම ග්‍රාම සංවර්ධන සමිතිය | නාම පුවරු ගාස්තු | 11,500.00 |
| 2 | ඉනෝකාදිල්රුක්ෂි | ෂෙම්රොක් පෙරපාසලේ ඇතුළත්වීමේ ගාස්තු | 4,200.00 |
| 3 | ලේකම්, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව | S. ගෝපිකා මෙනවියගේ ගමන් ගාස්තු ආපසු නොගැනීම නිසා තැන්පත් කිරීම | 830.00 |
| 4 | ඉනෝකා දිල්රුක්ෂි | ෂෙම්රොක් පෙරපාසලේ ඇතුළත්වීමේ ගාස්තු | 2,000.00 |
| 5 | ඉනෝකා දිල්රුක්ෂි | ෂෙම්රොක් පෙරපාසලේ ඇතුළත්වීමේ ගාස්තු | 500.00 |
| 6 | ඉනෝකා දිල්රුක්ෂි | ෂෙම්රොක් පෙරපාසලේ මාසික ගාස්තු | 2,000.00 |
| 7 | ඉනෝකා දිල්රුක්ෂි | ෂෙම්රොක් පෙරපාසලේ මාසික ගාස්තු | 2,000.00 |
| 8 | S.A.A.R. සිද්ධිලෙබ්බේ | ජයසුන්දර අංක 32 දරණ ස්ථානයේ ගවමස් වෙළදාම සඳහා දිනකට ගාස්තුගෙවීමේ මුදල මාස 03ක් සඳහා තැන්පත් කිරීම | 121,500.00 |
| 9 | ඉනෝකා දිල්රුක්ෂි | ෂෙම්රොක් පෙරපාසලේ මාසික ගාස්තු | 1,485.50 |
| 10 | ඉනෝකා දිල්රුක්ෂි | ෂෙම්රොක් පෙරපාසලේ ඇතුළත්වීමේ ගාස්තු | 200.00 |
| 11 | ඉනෝකා දිල්රුක්ෂි | ෂෙම්රොක් පෙරපාසලේ මාසික ගාස්තු | 2,000.00 |
| 12 | ඉනෝකා දිල්රුක්ෂි | ෂෙම්රොක් පෙරපාසලේ මාසික ගාස්තු | 4,000.00 |
| 13 | කැලුම් මල්සිරි | සභාවට අයවිය යුතු මුදල් ලබා ගැනීම | 24,597.24 |
| 14 | පළාත්සංස්කෘතික අධ්‍යක්ෂ | J.M.S. ජයලත් මියගේ වැටුප් රහිත නිවාඩු අයකර ගැනීම | 4,600.00 |
| 15 | ඉනෝකාදිල්රුක්ෂි | ෂෙම්රොක් පෙරපාසලේ මාසික ගාස්තු | 4,000.00 |
| 16 | ඉනෝකා දිල්රුක්ෂි | ෂෙම්රොක් පෙරපාසලේ ඇතුළත්වීමේ ගාස්තු | 100.00 |
| 17 | ශක්තිප්‍රජා මණ්ඩලය | බාර්කේපල් පහළ කොටස මාර්ගය සංවර්ධනය කිරීම (පරිපාලන වියදම්) | 20,722.01 |
| 18 | ඉනෝකා දිල්රුක්ෂි | ෂෙම්රොක් පෙරපාසලේ මාසික ගාස්තු | 2,000.00 |
| | | | **208,234.75** |
| | **මුළුඑකතුව** | | **642,706.90** |

<u>ගරු මන්ත්‍රී කේ.ඕ සෝමතිලක මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 10 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
සභාවට අවශ්‍ය උපකරණ වීදුරු 25, කොසු 3, ඉදල් 2, වයිපර් 2, මොප් 2, ටොයිලට් බ්‍රෂ් 2, වීදුරු තසිම් 25, කේතලයක්, ජොග්ගු 2, පිහියක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මහින්ද ගුණසේකර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 11 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ජල පාරිභෝගිකයන් වෙත ජල සම්බන්ධතාවය ලබා දීමේදී ජල උපකරණවල වර්තමාන මිල ගණන් ඉහළ ගොස් ඇති බැවින් 2022.10.12 දින පැවති මුදල් කමිටුවේ නිර්දේශ අනුව පහත සඳහන් පරිදි මිල ගණන් සංශෝධනය කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.
නව ජල සම්බන්ධය ලබා දීම සඳහා ඇස්තමේන්තු මුදල (මනු රහිත)

★ දෙකිඳ, වැවේගම, කළුගල්හින්න, බලංතොට සඳහා - රු. 18,830.00
★ පහළ රඹුක්පිටිය, මීපිටිය, වැලිගම්පොල සඳහා - රු. 23,805.00
★ උඩ රඹුක්පිටිය, බච්චාගම, පල්ලේගම, වරකාව, වැලිගොඩවත්ත, සෝලංකන්ද, දඹුබැදිරුප්ප, මොන්ට්ක්‍රිස්ටෝ, ගෝනාවලපතන - රු. 22,385.00

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 – 12 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
අප සභාවේ අනුග්‍රහය ඇතිව බල ප්‍රදේශයේ සවි කනු ලබන පුවරු සකස් කිරීමට පෑස්සුම් උපකරණ කට්ටලයක් නොමැති වීම හේතුවෙන් සුළු කාර්යයකට වුවද විශාල වියදමක් දැරීමට සිදු වේ. පෑස්සීම පිළිබඳ පුහුණු ශ්‍රමිකයින්ද සිටින බැවින් පෑස්සුම් උපකරණ කට්ටලයක් ලබා ගත හොත් අඩු වියදමකින් හා ප්‍රමිතියෙන් යුතු පුවරු සකස් කර ගැනීමට හැකියාව ඇත. එබැවින් ධාරිතාවය 350W ප්‍රමාණයේ පෑස්සුම් උපකරණ කට්ටලයක් මිලදී ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 13 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතාගේ 2022 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් රු. 125,000.00 ක මුදලක් වරකාව ගම මැද මාර්ගයේ පැච් වැසීම වෙනුවෙන් යෝජනා ස්ථිර වී තිබූ අතර එම යෝජනාව වරකාව පොදු සුසාන භූමියේ කට්ටි වෙන්කර නිසි පරිදි සකස් කිරීම ලෙස සංශෝධන කර උක්ත මුදල ඒ සඳහා වරකාව අවමංගල්‍යාධාර සමිතිය වෙත ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එච්.ජී මහින්ද ගුණසේකර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 14 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
AVONS HOLDINGS වෙතින් ගලබඩ දියඇල්ල ආශ්‍රිත ප්‍රදේශය අවුරුදු 33 ක් සඳහා බදු පදනම යටතේ ලබා ගැනීමට කරන ලද ඉල්ලීමට අනුව පරිසර නිලධාරි විසින් ව්‍යාපෘති වාර්තාවක් සකස් කර එමගින් ලැබෙන ආදායම සලකා බලා ටෙන්ඩර් කිරීමට සලකා බැලීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ඉදිරි සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී කේ.ඕ සෝමතිලක මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 15 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ගරු මන්ත්‍රී එම්. ජී. ඩබ්. කේ. ශිරෝමි මැණිකේ මියගේ 2022 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් රු. 100,000.00 ක මුදලක් දෙකිඳ වටගොඩහින්න පාර සංවර්ධනය වෙනුවෙන් යෝජනා ස්ථිර වී තිබූ අතර එම යෝජනාව දෙකිඳ ශ්‍රී ධම්මරතන විදුහලේ පඩිපෙළ සංවර්ධනය ලෙස සංශෝධන කර උක්ත මුදල හා දෙකිඳ ශ්‍රී ධම්මරතන විදුහලේ පාසල් සංවර්ධන සමිතිය වෙත ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රීටී.ඒ.ඩී.සී දමයන්ති මිය</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 16 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ වැසිකිළි පද්ධතිය සකස් කිරීම දෙවන අදියර සඳහා වන රු. 3,402,604.48 ක් වූ තාක්ෂණ නිලධාරි ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බව මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 17 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
මාපාකන්ද දකුණ කේ. එම්. රම්බංඩා මහතාගේ නිවෙස දෙසට යන අතුරු මාර්ගයේ ඇති ඇල හරහා එලීමට බෝක්කු බට 03 ක් මාපාකන්ද දකුණ ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලබා දීම සුදුසු බව මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී කේ.ඕ සෝමතිලක මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 18 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
සභාවට අයත් ග්‍රීන්වුඩ් කළුගල් ව්‍යාපෘතිය සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් ලබා දෙන කැණීම් බලපත්‍රය ලබා ගැනීමට C කාණ්ඩයේ බලපත්‍රය සඳහා රු. 100,000.00 ක බැංකු ඇපකරයක් නව ගිණුමක තැන්පත් කළ යුතු බව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය පෙන්වා දෙන ලදි. එම මුදල බලපත්‍රය වලංගු කාල සීමාව තුළ ගිණුමේ තැන්පත් කර තැබිය යුතුය. එබැවින් කැණීම් බලපත්‍රය ලබා ගැනීම සඳහා රු. 100,000.00 ක බැංකු ඇපකරයක් තැන්පත් කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී කේ.ඕ. සෝමතිලක මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 – 19 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභා ගොඩනැඟිල්ලේ ඉහළ මහල කුලියට දීමේදී සියලුම පෙර පාසල් හා පාසල් දරුවන්ට දිනකට රු. 2,000.00 ක් හා පෞද්ගලික පන්ති පැවැත්වීමට දිනකට රු. 2,000.00 ක් අය කිරීම සුදුසු බවටත් වායු සමීකරණ භාවිතා කරන්නේ නම් අමතර රු. 2,000.00 ක් Projector යන්ත්‍රය භාවිතා කරන්නේ නම් අමතර රු. 2,000.00 ක් අය කිරීම සුදුසු බවටත් මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රීජී.කේ.පී ෆොන්සේකා මිය</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 – 20 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
නො. 5/4, හල්දොරවත්ත, බලංතොට, රඹුක්පිටිය ලිපිනයෙහි පදිංචි සුනිල් විමලසූරිය මහතාගේ නිවසට ගසක් කඩා වැටීම හේතුවෙන් නිවස දැඩි අලාභහානියට පත්ව ඇත. මේ දිනවල පවතින අධික වර්ෂාව හේතුවෙන් එම නිවැසියන් දැඩි අසීරුතාවයකට පත්ව ඇති බැවින් හදිසි මිලදී ගැනීමක් ලෙස එම නිවස තාවකාලිකව ආවරණය කර ගැනීම සඳහා අවශ්‍ය වැසි ආවරණයක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 – 21 ගරු මන්ත්‍රී එච්.ජී මහින්ද ගුණසේකර මහතා
වැලිගම්පල ප්‍රධාන මාර්ගයේ බෝක්කුව අසල ප්‍රාදේශීය සභාවේ ජල සැපයුමේ නල ආවරණය කිරීම සඳහා සිමෙන්ති මිටි 03 ක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 – 22 ගරු මන්ත්‍රී එච්.ජී මහින්ද ගුණසේකර මහතා
2 කණුව සිට වැලිගම්පල මාර්ගයේ ඇති පාලම දෙපස ඉවුරු කැඩී ඇති බැවින් එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදවා ඉවුරු පිලිසකර කිරීම සඳහා රු. 100,000.00 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 23 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2023 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි නිකුත් කරනු ලබන අක්කර බදු පැනවීම සුදුසු බවට මම යෝජනා කරමි.

**2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම**

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ .............................. වන දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක............ යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 දින වලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.
2023 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සීයට පහක (5%) වට්ටමක් ගෙවනු ලැබේ.
.

ඕ.ජී.රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ නොවැම්බර් මස.......වන දින
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී.

**යෝජනාව**
**උපලේඛනය**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ-
(අ)146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරි ඇති බලතල ප්‍රකාරපස්බාගේ ප්‍රාදේශිය සභා ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමකම2022 වර්ෂයේදි බලාත්මක කරන ලද සතොක්ෂණය 2023 වර්ෂයේ සඳහා පිළිගැනිමටත්,

(ආ) 134 වන වගන්තියේ (3) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර,එකීඋප වගන්තියේ පළමු අතුරු විධානය යටතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී

ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (21) වන කොටසේ 1989.02.03 වන දිනැති ගැසට් පත්‍රයේ පල කරන ලද නියමයකින් අක්කර බද්දනියම කිරීමේ සහ අය කිරීමේ කාර්යය සඳහාපළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටිහෙක්ටෙයාර් දෙකකට නොඅඩු එහෙත් හෙක්ටයාර් පහකට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (50.00) අනු ප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි සෑම ඉඩමක සෑම හෙක්ටයාරයක් මතරුපියල් දහය(10.00) බැගින් වන 2023 වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරිමටත්, සහ

(ඇ) 134 වන වගන්තියේ (6) වන උප වගන්තියෙන්පැවරී ඇති බලතල ප්‍රකාර යථෝක්තබද්ද 2023 වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලින්අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධානය කිරීමටපස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරයි.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව සභාවේ අක්කර බදු පැනවීමේ ගාස්තු අය කිරීම් ඉහත දැක්වෙන ආකාරයට ගැසට් පත්‍රයේ පළ කිරිම සුදුසු බවට ඒකමතිකව තිරණය කරන ලදී.

<u>05 – 24 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2023 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි වරිපනම් බදු පැනවීම සුදුසු බවට මම යෝජනා කරමි.

**2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම**

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ...................................... වන දින පවත්වන ලද සභා රැස්වීමේදි යෝජනා අංක....................... යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඕ.ජී.රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ නොවැම්බර් මස.......වන දින
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී.

**යෝජනාව**

**උපලේඛනය**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ-

(අ) 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරි ඇති බලතල ප්‍රකාරපස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ දියුණු කල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල පිහිටි සියලුම නිවාසවලගොඩනැගිලිවල, ඉඩම් වල හා ගෙපත් වල 2011 වර්ෂයේදි බල පැවැත් වූ වාර්ෂික තක්සේරු වටිනාකම මත බව්වාගම කොට්ඨාශය 50% (සියයට පනහ) ක් ලෙසද කඩියන්ලෙන කොට්ඨාශය 25%(සියයට විසිපහ) ක් ලෙස ද ප්‍රතිශතාත්මකව සංශෝධනය වන අතර එම නව ප්‍රතිශතාත්මකව සංශෝධනය 2023 වර්ෂය සඳහා පිළිගැනිමටත්,

(ආ) 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ දියුණු කල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ තුළ සියලුම නිවාසවල,ගොඩනැගිලිවල,ඉඩම්වල හා ගෙපත්වලවාර්ෂික වටිනාකමින්,

1. දෙකිද පාර වම

2. දෙකිද පාර දකුණ
3. සේලම්බ්‍රිජ් වම
4. සේලම්බ්‍රිජ් දකුණ
5. බව්වාගම පටුගම වම
6. බව්වාගම පටුගම දකුණ
7. ඉඹුල්පිටිය වත්ත පාර වම
8. ඉඹුල්පිටිය වත්ත පාර දකුණ
9. ඉඹුල්පිටිය වත්ත පාර 1 පටුමග වම
10. ඉඹුල්පිටිය වත්ත පාර 1 පටුමග වම
11. ඉඹුල්පිටිය වත්ත පාර 11පටුමග වම
12. ඉඹුල්පිටිය වත්ත පාර 11පටුමග දකුණ
13. ඉඹුල්පිටිය නිවාස ක්‍රමය වම

14. ඉඹුල්පිටිය නිවාස ක්‍රමය දකුණ
15. සුසාණ භූමිය පාර දකුණ
16. කිතුල්තොට පටුමග වම
17. කිතුල්තොට පටුමග දකුණ
18. හගරන්ඔය පාර වම
19. හගරන්ඔය පාර දකුණ
20. බෙනඩික් මාවත වම
21. බෙනඩික් මාවත දකුණ

යන දියුණු කල ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපලක් මතම සීයට පහක (5%) වරිපනමක්ද

1. කොත්මලේ පාර වම
2. කොත්මලේ පාර දකුණ
3. තියටර් පටුමග වම
4. තියටර් පටුමග දකුණ

යන දියුණු කල ප්‍රදේශවල පිහිටි සෑමනිශ්චලයන දේපලක්මතමසීයටඅටක (8%) වරිපනමක්ද
2023 වර්ෂයේ දී පනවා අයකිරිමටත්, සහ

(ඇ) 134 වන වගන්තියේ (6) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර යථෝක්ත බද්ද 2023 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු හතර තුළදි සමාන වාරික හතරකින් ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරිමට පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභාව යෝජනා කරන්නීය.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව සභාවේ වරිපනම් බදු පැනවීමේ ගාස්තු අය කිරිම් ඉහත දැක්වෙන ආකාරයට ගැසට් පත්‍රයේ පළ කිරිම සුදුසු බවට ඒකමතිකව තිරණය කරන ලදී.

<u>05 – 25 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2023 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි වාහන හා සතුන් මත බදු පැනවීම සුදුසු බවට මම යෝජනා කරමි.

**2023 වර්ෂය සඳහා වාහන හා සතුන් මත බදු පැනවීම**

පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභාව විසින් 2022 වර්ෂයේ ...................................... වන දින පවත්වන ලද සභා රැස්වීමේදි යෝජනා අංක..................... යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.
ඒ අනුවපස්බාගේ කොරළේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින්, ඒකි වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30 ක් සම්පූර්ණ වූ වහාම 2023 වර්ෂය සඳහා වන මෙම බද්ද පස්බාගේ කොරළේ ප්‍රාදේශිය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඕ.ජී.රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ නොවැම්බර් ........ වන දින
පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභා කාර්යාලයේදී.

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 147 වන උප වගන්තිය සමඟ කියවිය යුතු එකි පනතේ 148 වන වගන්තිය සහ 4 වන උප ලේඛනයේ විධිවිධාන වලින් ප්‍රාදේශිය සභාවට ලැබි ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂයේදි පහත උප ලේඛනයේ පළමුවන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම එහි II තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2023වර්ෂය සඳහා පනවා අය කිරිමට පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභාව යෝජනා කරයි.

**උපලේඛනය**

**<u>I වන තීරුව</u>** **<u>II වන තීරුව</u>**

මෝටර් රථයක්, මෝටර් ත්‍රියිකාරයක්,මෝටර් ලොරියක්,
මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්,

| | |
|---|---|
| බයිසිකල්හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | රු. 25.00 |
| සෑම බයිසිකල් හෝ ට්‍රයියිසිකල් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා | |
| (අ) වෙළඳ කාරයක් සඳහා යොදවන්නේ නම් | රු. 18.00 |
| (ආ) වෙළඳ නොවන කාරයක් සඳහා යොදවන්නේ නම් | රු. 4.00 |
| සෑම කරත්තයක් සඳහා | රු. 20.00 |
| සෑම අත් කරත්තයක් සඳහා | රු. 10.00 |
| සෑම රික්ෂෝවක් සඳහා | රු. 7.50 |
| සෑම අශ්වයෙකු, පෝනියෙකු, කොටළුවෙකු සඳහා | රු. 15.00 |
| සෑම ඇතෙකු සඳහා | රු. 50.00 |

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථාන වල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත හා වෙළඳ කාර්යයන් සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීම් වලින් නිදහස් කෙරේ.

මෙහි උපලේඛනයේ "වෙළඳ කාර්යය" යන්න විකිණීම සඳහා හෝ අන් ආකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ ද්‍රව්‍ය හෝ යම් ලිඛිත නැතහොත් ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරිම ඇතුළත්

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව සභාවේ වාහන හා සතුන් මත බදු පැනවීමේ ගාස්තු අය කිරීම් ඉහත දැක්වෙන ආකාරයට ගැසට් පත්‍රයේ පළ කිරිම සුදුසු බවට ඒකමතිකව තිරණය කරන ලදී.

<u>05 – 26 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2023 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි කර්මාන්ත බදු පැනවීම සුදුසු බවට මම යෝජනා කරමි.

**2023 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම**

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ............................................. වන දින පවත්වන ලද සභා රැස්වීමේදි යෝජනා අංක................. යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ මාර්තු 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඕ.ජී.රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ නොවැම්බර් ........ වන දින
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියේ ප්‍රාදේශීය සභාවලට වෙත ලැබී ඇති බලතල ප්‍රකාර-

(අ) පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උප ලේඛනයේ පළමුවන තීරුවේ නිරූපිත යම් කර්මාන්තයක්සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම මත එම උප ලේඛනයේ දෙවන තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත ප්‍රමාණය අනුව කර්මාන්ත බද්දක් 2023 වර්ෂය වෙනුවෙන් පනවා අය කිරිමටත්,
(ආ) 2023 වර්ෂයේ මාර්තු මස 31 වන දින පැවති යම් කර්මාන්තයක් සම්බන්දයෙන් වූ විට යථෝක්ත බද්ද2023 අප්‍රේල් මස පලමු වන දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශිය සභාවටගෙවනු ලැබිය යුතු යැයිවිධානය කිරීමටත්,සහ

(ඇ)2023 වර්ශයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විටයථෝක්තබද්දකර්මාන්තය ආරම්භ කර මාස 3ක් ඇතුළත කර්මාන්තයකරගෙනයනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශියසභාවට ගෙවනුලැබිය යුතුයැයිවිධානය කිරීමටත්පස්බාගේකෝරළේප්‍රාදේශියසභාව යෝජනා කරයි

**උපලේඛනය**

| **I වන තීරු** | **II වන තීරුව** |
|---|---|
| **වාර්ෂික වටිනාකම රු.750.00 නො ඉක්මවවන අවස්ථාවක** | **රු.500.00** |
| **වාර්ෂික වටිනාකම රු.750.00 ඉක්මවන ඒහෙත් රු.1500.00නො ඉක්මවන අවස්ථාවක** | **රු. 750.00** |
| **වාර්ෂික වටිනාකම රු.1500.00 ඉක්මවන අවස්ථාවක** | |

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව සභාවේ කර්මාන්ත බදු පැනවීමේ ගාස්තු අය කිරීම් ඉහත දැක්වෙන ආකාරයට ගැසට් පත්‍රයේ පළ කිරීම සුදුසු බවට ඒකමතිකව තිරණය කරන ලදී.

05 – 27 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2023 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි ව්‍යාපාර බදු පැනවීම සුදුසු බවට මම යෝජනා කරමි.

**2023 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම**

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ...................................... වන දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක................. යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ මාර්තු 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඕ.ජී.රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ නොවැම්බර් ........ වන දින
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී.

**යෝජනාව**

" 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උප වගන්තියේ ප්‍රාදේශිය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනිම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේදි කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උප ලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයකම සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්ද 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකි ව්‍යාපාර බද්ද 2023 වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභාවට ගෙවිය යුතු යැයි පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභාව යෝජනා කරන්නිය."

**උපලේඛනය**

| **I වන තීරුව**<br>වර්ෂය සඳහා ව්‍යාපාරයේ වෘත්තිය ආදායම | **II වන තීරුව**<br>අයකිරිමට තීරණය කළ බද්ද<br>රු. ශත |
|---|---|
| 1. රු.6000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| 2. රු.6000 ඉක්මවන එහෙත් රු.12000 නොඉක්මවන අවස්ථාවක | 90.00 |

3. රු.12000ඉක්මවන එහෙත්රු.18750නොඉක්මවන අවස්ථාවක 180.00
4. රු18750ඉක්මවන එහෙත්රු.75000 නොඉක්මවන අවස්ථාවක 360.00
5. රු.75000ඉක්මවන එහෙත්රු.150000 නොඉක්මවන අවස්ථාවක 1200.00
6. රු. 150000 වැඩිඉක්මවන අවස්ථාවක 3000.00

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව සභාවේ ව්‍යාපාර බදු පැනවීමේ ගාස්තු අය කිරීම් ඉහත දැක්වෙන ආකාරයට ගැසට් පත්‍රයේ පළ කිරීම සුදුසු බවට ඒකමතිකව තිරණය කරන ලදී.

<u>05 – 28 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2023 වර්ෂය සඳහා පහත සදහන් පරිදි කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම සුදුසු බවට මම යෝජනා කරමි.

2023 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ...................................... වන දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක................................ යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ මාර්තු 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඕ.ජී.රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ නොවැම්බර් ........ වන දින
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී.

**යෝජනාව**

" ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවක් යටතේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උප ලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උප ලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උප ලේඛනයේ සඳහන් කර්මාන්තය ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක් වන විට, එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන් පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම් වලින් සියයට එකක (1%) කට සමාන ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

**උපලේඛනය**

| | <u>I වන තීරු</u> | | <u>II වන තීරුව</u> | |
|---|---|---|---|---|
| **අනු අංකය** | **බලපත්‍රයේ ස්වභාවය** | **වාර්ෂික වටිනාකම රු. 750 දක්වා** | **වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1500 දක්වා** | **වාර්ෂික වටිනාකම රු.1500 වැඩි** |

| | | රු. | ශත | රු. | ශත | රු. | ශත |
|---|---|---|---|---|---|---|---|
| 1. | බත්කඩ, ආපන ශාලා, තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 2. | ලැගුම් හලක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1,000 | |
| 3. | බේකරියක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 4. | හෝටලක් පවත්වාගෙන යාම500 00 | 750 | 00 | 1,000 00 | | | |
| 5. | සත්ව ගොවිපළක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 6. | කොණ්ඩා සැකසීමේ සැලුන්හල් හෝ බාබර් සාප්පුවක් හෝ බියුටි සෙන්ටර් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 7. | කිරිපිටි හෝ කිරි වෙළඳාම් කිරිමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 8. | මාළු විකිණිමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 9. | ජලය බෝතල් කිරිමේ ස්ථානයක් හෝ සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 10. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 11. | ආහාර ද්‍රව්‍ය වෙළඳාම් කිරිමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 12. | මස් කඩයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 13. | ඌරන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |

<u>අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර :-</u>

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 2. | මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරිම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 3. | මුද්‍රණාලයක් පැවත්වීම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 4. | කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් කොටුවක් පැවැත්වීම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 5. | ගඩොල් හෝ උළු ගබඩා කොට තැබීම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 6. | දර ගබඩාවක් පැවත්වීම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 7. | කළුගල් කැනීම හෝ කැඩීම යන්ත්‍රාණුසාරයෙන් හෝ අතින් | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 8. | සිසිල් බීම නිශ්පාදනය හෝ සිසිල් බීම 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරිම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 9. | පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරිම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 10. | අයිස්ක්‍රීම් නිෂ්පාදනය | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 11. | ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දූසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරිම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 12. | කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිශ්පාදනය හෝ ගබඩා කිරිම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 13. | ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරිම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 14. | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |

| | | | |
|---|---|---|---|
| 15. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවත්වීම | 500 00 | 750 00 | 1,000 00 |
| 16. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම | 500 00 | 750 00 | 1,000 00 |
| 17. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවත්වීම | 500 00 | 750 00 08 | 1,000 00 |
| 18. හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩා කර තබා ගැනීම | 500 00 | 750 00 | 1,000 00 |
| 19. පාපැදි හෝ යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම | 500 00 | 750 00 | 1,000 00 |
| 20. පාවිච්චි කරන ලද පත්තර හෝ කඩදාසි ගබඩා කර තබා ගැනීම | 500 00 | 750 00 | 1,000 00 |
| 21. විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 00 | 750 00 | 1,000 00 |
| 22. ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම | 700 00 | 975 00 | 1,250 00 |
| 23. පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ය වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500 00 | 750 00 | 1,000 00 |
| 24. ශීතකල මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම | 500 00 | 750 00 | 1,000 00 |
| 25. දැව ගබඩා කිරීම | 500 00 | 750 00 | 1,000 00 |
| 26. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම | 500 00 | 750 00 | 1,000 00 |
| 27. ඩ්‍රයි ක්ලීන් කිරීම හෝ සායම් දැමීම | 500 00 | 750 00 | 1,000 00 |
| 28. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම | 500 00 | 750 00 | 1,000 00 |
| 29. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 00 | 750 00 | 1,000 00 |
| 30. හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම | 500 00 | 750 00 | 1,000 00 |
| 31. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 00 | 750 00 | 1,000 00 |
| 32. මෝටර් වාහන සේවා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 00 | 750 00 | 1,000 00 |
| 33. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම | 500 00 | 750 00 | 1,000 00 |
| 34. බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම | 500 00 | 750 00 | 1,000 00 |
| 35. ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 00 | 750 00 | 1,000 00 |
| 36. ආර්යුවේද ඖෂධ දේශීය ඖෂධ නිෂ්පාදන කිරීම හෝ සංයෝජනය කිරීම | 500 00 | 750 00 | 1,000 00 |
| 37. වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන | 500 00 | 750 00 | 1,000 00 |
| 38. කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 00 | 750 00 | 1,000 00 |
| 39. කිලෝග්‍රෑම් 150 ට වැඩියෙන් තේ කුඩු ගබඩා කර තබා ගැනීම | 500 00 | 750 00 | 1,000 00 |
| 40. වෑල්ඩිං සඳහා ස්ථානයක් පැවැත්වීම | 500 00 | 750 00 | 1,000 00 |
| 41. ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපළක් පවත්වා ගෙන යාම | 500 00 | 750 00 | 1,000 00 |
| 42. තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වා ගෙන යාම | 500 00 | 750 00 | 1,000 00 |
| 43. කෘෂි රසායනික/රසායනික පොහොර ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම | 500 00 | 750 00 | 1,000 00 |
| 44. වායු සමනය යන්ත්‍ර,ශිතකරණ හෝ අධි ශිතකරණ සේවාකරණ හෝ අලුත්වැඩියාව | 500 00 | 750 00 | 1,000 00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 45.විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත් වැඩියා කිරීමේ වැඩපලක් පවත්වා ගෙන යාම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 46.කිරි ශිතකිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 47.සම් පදම් කිරීම | 500 | 00 | 750 | 00 | 1,000 | 00 |
| 48.සත්ව පාලනය(මස්,කිරි හෝ බිත්තර) | 500 | 00 | 750 | 00 | 1,000 | 0 |
03. පොත් බැහැර දීම - 1,175

04. ව්‍යාප්ත සේවා - 2022 සාහිත්‍ය මාසය වෙනුවෙන් ජංගම පුස්තකාලවල පාඨක තරඟ පැවැත්වීම

05. රැස්කළ ආදායම (පුස්තකාල) - 3,310.00

(නැණසල) - 1,868.00

**08.<u>ටෙන්ඩර් මණ්ඩලය</u>**

08 – 01 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව බල ප්‍රදේශයේ අධික වර්ෂාව හේතුවෙන් ආපදාවට ලක්වූ පාලම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම

**ටෙන්ඩර් කරන ලද කර්මාන්ත සඳහා ඉදිරිපත් කරන ලද මිල ගණන් විස්තර**

| අනු අංකය | කර්මාන්තය | ලංසුකරුවන්ගේ නම හා ලිපිනය | ඉදිරිපත් කරන ලද මිල ගණන් |
|---|---|---|---|
| 1 | බෝහිල්වත්ත පාලම ඉදි කිරීම (CPC/PBK/PS/ER1/2022/01) | A.B.W.R.P.W.E.B. බණ්ඩාරනායක, කළමනාකරු, බණ්ඩාරනායක බිල්ඩර්ස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස්, 22/2, උල්ලඳුපිටිය, වැල්ලගම | 42,995,484.13 |
| | | අජිත් කන්ස්ට්‍රක්ෂන්ස්, ගවර්න්මන්ට් කන්ට්‍රැක්ටර් ඇන්ඩ් බිල්ඩින් මෙටීරියල් සප්ලයර්ස්, 135, නුවර පාර, ගෙලිඔය | 47,895,980.00 |
| 2 | ඉඟුරුඔය හරහා ඇති ඉඟුරුඔය පාලම ප්‍රතිසංස්කරණය කිරීම (CPC/PBK/PS/ER1/2022/02) | A.B.W.R.P.W.E.B. බණ්ඩාරනායක, කළමනාකරු, බණ්ඩාරනායක බිල්ඩර්ස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස්, 22/2, උල්ලඳුපිටිය, වැල්ලගම | 25,083,570.05 |
| | | අජිත් කන්ස්ට්‍රක්ෂන්ස්, ගවර්න්මන්ට් කන්ට්‍රැක්ටර් ඇන්ඩ් බිල්ඩින් මෙටීරියල් සප්ලයර්ස්, 135, නුවර පාර, ගෙලිඔය | 24,703,665.00 |
| | | ජයවික්‍රම කන්ස්ට්‍රක්ෂන්ස්, 22, මල්ලන්ද පාර, නාවලපිටිය | 18,248,353.40 |
| 3 | දොරුවාදෙණිය හා වරකාව අතර එල්ලෙන පාලම ප්‍රතිසංස්කරණය කිරීම (CPC/PBK/PS/ER1/2022/03) | A.B.W.R.P.W.E.B. බණ්ඩාරනායක, කළමනාකරු, බණ්ඩාරනායක බිල්ඩර්ස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස්, 22/2, උල්ලඳුපිටිය, වැල්ලගම | 6,173,835.00 |
| | | අරෝ කන්ස්ට්‍රක්ෂන්ස්, පිටියගෙදර, නුගලියද්ද, තලාතුඔය | 5,782,219,20 |
| | | ජයවික්‍රම කන්ස්ට්‍රක්ෂන්ස්, 22, මල්ලන්ද පාර, නාවලපිටිය | 5,350,480.00 |
| 4 | ගලබොඩ පාර පැරණි තේ කම්හල අසල බෝක්කුවේ ඉතිරි වැඩ නිම කිරීම (CPC/PBK/PS/ER1/2022/04) | දසනායක කන්ස්ට්‍රක්ෂන්ස්, වැගම ගෙදර, පූලියද්ද | 3,491,204.85 |
| | | ඇරෝ කන්ස්ට්‍රක්ෂන්ස්, පිටියගෙදර, නුගලියද්ද, තලාතුඔය | 3,265,151.00 |
| | | B. S. J. එන්ටර්ප්‍රයිසස්, 20/1, මල්ලන්ද පාර, නාවලපිටිය | 3,297,075.00 |

## Report of Technical Evaluation Committee

| No | Project | Bidder Name | Engineer Cost Rs. | Bidder Cost Rs. | |
|---|---|---|---|---|---|
| 1 | Bohaill | Bandaranayake Builders and Construction | 43,567,040.26 | 43,591,359.13 | 24,318.87 |
| | | Ajith Construction | 43,567,040.26 | 47,895,980.00 | 4,328,939.74 |
| 2 | Inguru Oya | Bandaranayake Builders and Construction | 21,653,770.76 | 25,294,260.06 | 3,640,489.30 |
| 3 | Dorawadeniya | Jayawickrama Construction | 6,314,471.26 | 5,350,480.00 | (963,991.26) |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | Bandaranayke Group | 6,314,471.26 | 6,173,835.00 | (140,636.26) |
| | | Arrow Construction | 6,314,471.26 | 6,743,931.20 | 429,459.94 |
| 4 | Galaboda | Arrow Construction | 3,541,310.46 | 3,265,151.00 | (276,159.46) |
| | | BSJ Enterprises | 3,541,310.46 | 3,297,075.00 | (244,235.46) |
| | | Dasanayake Construction | 3,541,310.46 | 3,490,124.85 | (51,185.61) |

1. බෝහිල්වත්ත පාලම ඉදි කිරීම

උක්ත මිල ගණන් හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇති අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති බණ්ඩාරනායක බිල්ඩර්ස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස්, 22/2, උල්ලඳුපිටිය, වැල්ලගම යන ආයතනයට ටෙන්ඩරය ලබා දීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

2. ඉඟුරුඔය හරහා ඇති ඉඟුරුඔය පාලම ප්‍රතිසංස්කරණය කිරීම

උක්ත මිල ගණන් හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇත්තේ බණ්ඩාරනායක බිල්ඩර්ස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස්, 22/2, උල්ලඳුපිටිය, වැල්ලගම යන ආයතනයයි. ලංසු ඉදිරිපත් කර ඇති ජයවික්‍රම කන්ස්ට්‍රක්ෂන්ස්, 22, මල්ලන්ද පාර, නාවලපිටිය ආයතනයට පාලම් ඉදිකිරීම සඳහා අවශ්‍ය ශ්‍රේණිය නොමැති වීම නිසා තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර ඇත. අජිත් කන්ස්ට්‍රක්ෂන්ස්, ගවර්න්මන්ට් කන්ට්‍රැක්ටර් ඇන්ඩ් බිල්ඩින් මෙටීරියල් සප්ලයර්ස්, 135, නුවර පාර, ගෙලිඔය යන ආයතනය ඉදිරිපත් කර ඇති ලංසුවේ අයිතම 3 ක් සඳහා මිල ගණන් අඩුවෙන් ඉදිරිපත් කර ඇති නිසා එම ආයතනයද තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර ඇත. ඒ අනුව, මේ සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමක් හෝ නැතහොත් ටෙන්ඩර්කරු සමඟ සාකච්ඡා කොට ඉංජිනේරු ඇස්තමේන්තුව සඳහා එකඟ කර  යුතුය. නැවත ටෙන්ඩර් කැඳවීම දීර්ඝ ක්‍රියාවලියක් බැවින් සුදුසුම ක්‍රමය වන්නේ ටෙන්ඩර්කරු සමඟ සාකච්ඡා කිරීමයි. ඒ අනුව, ටෙන්ඩර්කරු ටෙන්ඩර් මුදලෙන් 5% ක ප්‍රමාණයක් අඩු කිරීමට එකඟ වී ඇත. ඉංජිනේරු ඇස්තමේන්තුව 10% දක්වා වැඩි කිරීමට පළාත් සභාවට බලය පවතින බැවින් එම කරුණු මත ඇස්තමේන්තු සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඉතිරිවන වෙනස ටෙන්ඩර්කරු සමඟ සාකච්ඡා කොට එකඟතාවකට පැමිණීම සුදුසු බවත් ඒ අනුව මෙම ටෙන්ඩරය තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇති බණ්ඩාරනායක බිල්ඩර්ස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස්, 22/2, උල්ලඳුපිටිය, වැල්ලගම යන ආයතනයට ටෙන්ඩරය ලබා දීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

3. දොරුවාදෙණිය හා වරකාව අතර එල්ලෙන පාලම ප්‍රතිසංස්කරණය කිරීම

උක්ත මිල ගණන් හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇති අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති සහ එම කර්මාන්තය සඳහා අවශ්‍ය ICTAD සහතිකය හිමි ජයවික්‍රම කන්ස්ට්‍රක්ෂන්ස්, 22, මල්ලන්ද පාර, නාවලපිටිය යන ආයතනයට ටෙන්ඩරය ලබා දීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

4. ගලබොඩ පාර පැරණි තේ කම්හල අසල බෝක්කුවේ ඉතිරි වැඩ නිම කිරීම

උක්ත මිල ගණන් හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇති අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ඇරෝ කන්ස්ට්‍රක්ෂන්ස්, පිටියගෙදර, නුගලියද්ද, තලාතුඔය යන ආයතනයට ටෙන්ඩරය ලබා දීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 02 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සඳහා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| අනු අංකය | | එල්.එච්.චන්ද්‍ර සේකර සහෝදරයෝ | | | සුපර්කොම් ට්‍රේඩින් ප්‍රයිවට් ලිමිටඩ් | | ශ්‍රී ලංකා ස්ටෝර්ස් | | පේපර්ලයින් ට්‍රේඩින් | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වර්ගය | වැට් රහිත | වැට් සහිත | වර්ගය | වටිනාකම | වර්ගය | වටිනාකම | වර්ගය | වැට් රහිත | වැට් සහිත |
| 1 | නිල් පෑන් | Atlas | 18.27 | 21.00 | | | | 22.50 | | 17.00 | 19.55 |
| 2 | ලියුම් කවර 9x 4 | Manila | 5.07 | 5.83 | | | | 5.00 | | 4.50 | 5.17 |
| 3 | තනි පිටකාබන් | Prime 100 part | 1,265.22 | 1,455.00 | | | | 1,550.00 | | 1,160.00 | 1,334.00 |
| 4 | ලැමිනේටින්ක වර | A4 siz 100 pkt | 2,869.57 | 3,300.00 | | | 100 x 1 | 3,750.00 | 100 x 1 | 2,565.00 | 2,949.75 |
| 5 | ගම් බෝතල් ( ලොකු) | 750 ml saracla | 356.53 | 410.00 | | 200.00 | 750 ml | 395.00 | | 360.00 | 414.00 |
| 6 | වැසිකිලි පිරිසුදුකාරක | | | | vinwa 5L | 2,400.00 | 4 L | 1,620.00 | 5 L | 1,910.00 | 2,196.50 |
| | | | | | Opton ii ( Lekchem) 5L | 1,800.00 | | | | | |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අයිතම අංක 1, 3 හා 4 සඳහා අඩුම මිල ගණන් ඉදිරිපත් කර ඇති පේපර්ලයින් ට්‍රේඩින්ග්, මහනුවර වෙතින්ද, අයිතම අංක 2 සඳහා අඩුම මිල ගණන් ඉදිරිපත් කර ඇති ශ්‍රී ලංකා ස්ටෝර්ස්, නාවලපිටිය වෙතින්ද, අයිතම අංක 5 සඳහා අඩුම මිල ගණන් ඉදිරිපත් කර ඇති සුපර්කොම් ට්‍රේඩින්ග් ප්‍රයිවට් ලිමිටඩ්, මහනුවර වෙතින්දමිලදී ගැනීමටත් අයිතම අංක 6 වැසිකිළි පිරිසිදු කාරක සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 03 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සඳහා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| අනු අංකය | | New General Trading Kandy | Paperline Trading Kandy | | | Supercom Trading | | L.H. Chandrasekara Brothers | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වටිනාකම | වර්ගය | වැට් රහිත | වැට් සහිත | වර්ගය | වටිනාකම | වර්ගය | වැට් රහිත | වැට් සහිත |
| 1 | NPG 59 Toner | 11,950.00 | Canon Original | 22,300.00 | 25,645.00 | Canon | 13,500.00 | Canon | 23,086.96 | 26,550.00 |
| 2 | පැන්සල් | 32.00 | Nataraj | 20.00 | 23.00 | | | Nataraj | 26.90 | 30.94 |
| 3 | හයිලයිට් | 95.00 | Flecry | 75.00 | 86.25 | | | Manami | 116.31 | 133.76 |
| 4 | ලියුම්කවර 10 x 7 | 7.84 | Manila | 7.00 | 8.05 | | | Manila | 7.00 | 8.05 |
| 5 | GT 53 | 2,950.00 | Hp | 3,695.00 | 4,249.25 | H | 3000..00 | | 3,130.44 | 3,600.01 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | BLAC K INK | | Origi nal | | | p | | | | |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා අයිතම 2, 3 හා 4 සදහා අවම මිල ගණන් සපයා ඇති පේපර්ලයන් ට්‍රේඩින්ග්, මහනුවර ආයතනයෙන්ද, අයිතම 1 හා 5 සදහා වර්ගය ඉදිරිපත් කර අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති සුපර්කොම් ට්‍රේඩින්ග්, මහනුවර යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 04 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සදහා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැදවීම.

| අනු අංකය | විස්තරය | L.H. Chandrasekara Brothers | | | Paperline Trading Kandy | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ගය | බදුරහිත | බදුසහිත | වර්ගය | බදුරහිත | බදුසහිත |
| 1 | CR පොත් පිටු 80 | Atlas | 144.32 | 165.97 | | 153.00 | 175.95 |
| 2 | ක්ෂේත්‍රසටහන් පොත් | Weerodara Plain | 76.53 | 88.01 | | 154.00 | 177.10 |
| 3 | ස්ටේපර්පින් | NO 369 Greatwall | 72.79 | 83.71 | | 70.00 | 80.50 |
| 4 | සැනිටයිසර් | Sefguard 2l | 1,486.79 | 1,709.81 | 5 l | 3,200.00 | 3,680.00 |
| | | 1l | 626.09 | 720.00 | | | |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා අවම මිල ගණන් සපයා ඇති එල්. එච්. චන්ද්‍රසේකර ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 05 පත්තුනුපිටිය මහා විද්‍යාලයේ පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීමට මිල ගණන් කැදවීම.

| අනු අංකය | | සමුද්‍රපොත්හල | | සරසවිපොත්හල | | සිවලිපොත්හල | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ගය | වටිනාකම | වර්ගය | වටිනාකම | වර්ගය | වටිනාකම |
| 1 | මඩොල්දූව | | 300.00 | | 300.00 | | 300.00 |
| 2 | අපේගම | | 250.00 | | 400.00 | | 250.00 |
| 3 | සරලසංෂ්ප්ත පන්සිය පනස් ජාතකය | Bcc | 2,100.00 | | | | |
| 4 | පන්සියපනස් ජාතක පොත 1 | | 2,800.00 | | 600.00 | | |
| 5 | පන්සියපනස් ජාතක පොත 2 | | 2,800.00 | | 600.00 | | |
| 6 | පන්සියපනස් ජාතක පොත 3 | | | | 500.00 | | |
| 7 | පන්සියපනස් ජාතක පොත 4 | | | | 500.00 | | |
| 8 | පන්සියපනස් ජාතක පොත 5 | | | | 500.00 | | |
| 9 | පන්සියපනස් ජාතක පොත - සරල සංෂිප්තය | | | | | | 2,100.00 |
| 10 | සාමාන්‍යදැනුම 1 | My Tutor | 390.00 | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 11 | සාමාන්‍යදැනුම 2 | My Tutor | | | | | |
| 12 | ගෞතම බුද්ධචරිතය 1 | Dayawansa | 180.00 | | | | |
| 13 | ගෞතම බුද්ධචරිතය 2 | | 400.00 | | | | |
| 14 | ගෞතම බුද්ධචරිතය 3 | | 450.00 | | | | |
| 15 | ගෞතම බුද්ධචරිතය 4 | | 300.00 | | | | |
| 16 | ගෞතම බුද්ධචරිතය 5 | | 380.00 | | | | |
| 17 | හැරී පෝටර් - ඩෙන්ලි හැලොස් | | 1,350.00 | | | | |
| 18 | හැරී පෝටර් - අස්කබාන්හි සිරකරු | | 1,800.00 | | | | |
| 19 | හැරී පෝටර් - මාසාගල | | 1,500.00 | | | | |
| 20 | අම්මා | Godage | 1,100.00 | | 1,500.00 | | 1,290.00 |
| 21 | සුදුවැද්දා | | 600.00 | | | | 500.00 |
| 22 | සුදුවැද්දා 2 | | | | 350.00 | | |
| 23 | සුදුවැද්දා 3 අපරාජිතයා | | | | 300.00 | | |
| 24 | ගුරු ගීතය | | 350.00 | | | | 400.00 |
| 25 | එදා හෙළදිව | | 800.00 | | | | 800.00 |
| 26 | බැද්දේගම | | 550.00 | | 550.00 | | 550.00 |
| 27 | හැරී පෝටර්සහ රහස් කුටිය | | | | 1,500.00 | | |
| 28 | සුරුපිනලහන | | | | 850.00 | | |
| 29 | ලෝහිතපරීක්ෂණය | | | | 850.00 | | |
| 30 | සෝවියට්කෙටිකතා | | | | 480.00 | | 650.00 |
| 31 | වැරදුණුදඩයම | | | | 850.00 | | |
| 32 | සිබිරහස්සලකුණ | | | | 790.00 | | |
| 33 | ෂර්ලොක්හෝම්ආපසු එයි | | | | 475.00 | | |
| 34 | අපූරුඉස්කෝලේ අවසන් වාරේ | | | | 380.00 | | 300.00 |
| 35 | අපූරුඉස්කෝලේ අපූරු මිතුරිය | | | | 350.00 | | |
| 36 | හැරීපෝටර්හා අග්නි කුසලාන | | | | 1,350.00 | | |
| 37 | හැරීපෝටර්හා මයාගල | | | | 1,500.00 | | |
| 38 | මීටර් 100 දිවීම | | | | 300.00 | | |
| 39 | ක්‍රීඩාවසඳහා විද්‍යාව 1 | | | | 300.00 | | |
| 40 | ක්‍රීඩාවසඳහා විද්‍යාව 2 | | | | 300.00 | | |
| 41 | ක්‍රීඩාපුහුණුව විදූ ඇසින් | | | | 275.00 | | |
| 42 | මීටර් 400 දිවීම | | | | 300.00 | | |
| 43 | හෙල්ලයපුහුණුව | | | | 300.00 | | |
| 44 | යගුලියපුහුණුව | | | | 300.00 | | |
| 45 | උස පැණීමපුහුණුව | | | | 300.00 | | |
| 46 | උපන්දා සිටඩාල විය | | | | 225.00 | | 550.00 |
| 47 | හැරී පෝටර්සහ ඩෙන්ලි හැලෝස් | | | | 1,350.00 | | |
| 48 | ශ්‍රී ලංකාසාමාන්‍ය දැනුම | | | | 650.00 | | |
| 49 | ගණිතවිනෝදය | | | | 800.00 | | |
| 50 | රිටි පැණීමපුහුනුව | | | | 250.00 | | |
| 51 | ලෝකයෙන්දැනුම | | | | 500.00 | | |
| 52 | අසිරිමත්කඩොලාන | | | | 300.00 | | 300.00 |
| 53 | හැරී පෝටර්සහ ෆීනස් නිකාය | | | | 1,800.00 | | |
| 54 | බැස්තවිල්රුදුරු බල්ලා | | | | 850.00 | | |
| 55 | පුද්ගලිකයිරහසිගතයි | | | | 850.00 | | |
| 56 | හැරී පෝටර්සහ අස්තබාෆ්නි සිරකරු | | | | 1,800.00 | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 57 | සිද්ධාර්ථගෞතම බුද්ධ චරිතය | | | | 690.00 | | |
| 58 | හැරී පෝටර්සහ අඩ ලේ කුමාරයා | | | | 1,350.00 | | |
| 59 | වන තරණ | | | | 600.00 | | 250.00 |
| 60 | පාසල්ළමුන් සඳහා සාමාන්‍ය දැනුම | | | | 250.00 | | |
| 61 | බුද්ධචරිතය | | | | 750.00 | | |
| 62 | නොසැලෙන මනස | | | | | | 1,790.00 |
| 63 | මැටිල්ඩාසිංහල | | | | | | 570.00 |
| 64 | මනුතාපය | | | | | | 950.00 |
| 65 | මැකීගියදඩමන් | | | | | | 600.00 |
| 66 | අපූරුඉස්කෝලේ රාත්‍රී සවාරිය | | | | | | 350.00 |
| 67 | අපූරුඉස්කෝලේ අපූරු සාදය | | | | | | 300.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 06 VIRUS GUARD මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| අනු අංකය | විස්තරය | Computerage (Pvt) Ltd, Kandy | Supercom Trading, Kandy | The Office Shop, Kandy | Sence Micro Distributour, Kandy |
|---|---|---|---|---|---|
| | | වටිනාකම | වටිනාකම | වටිනාකම | වටිනාකම |
| 1 | Kaspersky 01 PC | 2,400.00 | 1,900.00 | 2,100.00 | 2,200.00 |
| 2 | Kaspersky 03 PC | 3,600.00 | 3,475.00 | 3,700.00 | 3,600.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇතිසුපර්කොම් ට්‍රේඩින්ග්, මහනුවර යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 07 ඇඳි සහිත / රහිත පුටු මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| අනු අංකය | විස්තරය | Supercom Trading | | D. R. Industries (Pvt) Ltd | | Seetha Holdings (Pvt) Ltd | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ගය | වටිනාකම | වර්ගය | වටිනාකම | වර්ගය | වටිනාකම |
| 1 | ඇඳි රහිත ප්ලාස්ටික් පුටු | නිල් කමල් | 3,117.00 | Damro (B.G. 22) | 2,479.50 | Phoenix Nelum | 2,990.00 |
| 2 | concard ඇඳි සහිත ප්ලාස්ටික් පුටු | නිල් කමල් | 4,092.00 | Damro | 2,318.00 | Phoenix Elite | 2,900.00 |
| 3 | Kingstar ඇඳි පුටු | පියෙස්ට්‍රා | 2,030.00 | | | | |
| 4 | ඇඳි රහිත ප්ලාස්ටික් පුටු D/c | ෆීනික්ස් | 2,750.00 | | | | |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 08 හයිඩ්‍රොලික් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| අනු අංකය | විස්තරය | Indika Moters | New kandyan Tyre Center | R.M. Nayantha Kelum |
|---|---|---|---|---|
| 1 | හයිඩ්‍රෝලික්ලීටර් 1 | 2,050.00 | 2,100.00 | 2,000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති ආර්. එම්. නයන්ත කැලුම්, කටාරන්දන, මල්දෙණිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 09 තීන්ත මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| අනු අංකය | විස්තරය | General Hardware | | Estate Suppliers Agency | | Nawalapitiya Paint House | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ගය | මිල ඒකකය | වර්ගය | මිල ඒකකය | වර්ගය | මිල ඒකකය |
| 1 | කොළ පාට ඇක්වා සීල් වෙදර්කොට් | Causway 11 | 3100.00 | Nippon 11 | 2980.00 | Nippon | 2660.00 |
| 2 | අළු පාටවෙදර්ෂීල් | Causway 11 | 3050.00 | Nippon 11 | 2900.00 | Nippon | 2460.00 |
| 3 | සුදු පාටඉමල්ෂාන් | Causway 11 | 3900.00 | Nippon 11 | 3700.00 | Nippon | 3340.00 |
| 4 | කළු පාටඉමල්ෂන් | Causway 11 | 3750.00 | Nippon 11 | 3500.00 | Nippon | 3130.00 |
| 5 | කහ පාටඉමල්ෂන් | Causway 11 | 3750.00 | Nippon 11 | 3500.00 | Nippon | 3130.00 |
| 6 | ගෝල්ඩ්ඉමල්ෂන් | Causway 11 | 6200.00 | Nippon 11 | 5900.00 | Nippon | 5240.00 |
| 7 | 4" පින්සල් | | 1450.00 | | 1300.00 | | 1200.00 |
| 8 | 2" පින්සල් | | 950.00 | | 900.00 | | 850.00 |
| 9 | ටිනර් 1L | 1L | 1450.00 | 1L | 1350.00 | Nippon | 1200.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහාඅවම මිල ගණන් සපයා ඇති නාවලපිටිය පේන්ට් හවුස්, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 10 උදලු තල සඳහා මිල ගණන් කැඳවීම.

| අනු අංකය | විස්තරය | Mahaweli Hardware | Keshawa Hardware |
|---|---|---|---|
| 1 | උදලු තල - 1 | 2,800.00 | 2,980.00 |
| 2 | මිටි - 1 (Kittul) | 800.00 | 320.00 |
| 3 | මිටි - 1 ( Normal) | 375.00 | |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උදලු තල සඳහා අවම මිල ගණන් සපයා ඇති මහවැලි හාඩ්වෙයාර්, බලන්තොට, නාවලපිටිය යන ආයතනයෙන් උදලු තල හා මිටි යන වර්ග 2 ම මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 11 ගලබඩ මුර කුටියේ වහලය අලුත්වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට මිල ගණන් කැඳවීම.

| අනු අංකය | විස්තරය | New Lanka Hardware | Mhaweli Hardware | Sri Asiri Hardware |
|---|---|---|---|---|
| | | වටිනාකම | වටිනාකම | වටිනාකම |
| 1 | GI Box 1 x1 bar 4 | 16200.00 | 15600.00 | 20800.00 |
| 2 | Weiding Rods 1kg | 1450.00 | 1450.00 | 1300.00 |
| 3 | Cutting Wheel 4 1/2 - 2 | 300.00 | 300.00 | 480.00 |
| 4 | Plain Regin sheet | 750.00 | 630.00 | 300.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති මහවැලි හාඩ්වෙයාර්, බලන්තොට, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 12 ගලබඩ මුර කුටියේ වහලය අලුත්වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට මිල ගණන් කැඳවීම.

| අනු අංකය | විස්තරය | Udakubura Steel | Sri Asiri Hardware |
|---|---|---|---|
| | | වටිනාකම | වටිනාකම |
| 1 | දිග අඩි 10 තහඩු 10 | 51,000.00 | 49,000.00 |
| 2 | කොකු ඇණ 2kg | 3,500.00 | 3,000.00 |
| 3 | රිවට් අඟල් 60 | 500.00 | 360.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති ශ්‍රී ආසිරි හාඩ්වෙයාර්, 2 කණුව, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 13 ඉඟුරුඔය පාලම සඳහා ලී මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| අනු අංකය | විස්තරය | jayanthi Saw Mill Timber Depot | Sujeewa Timber Stors Deport | Tharidu Timber Stors Deport |
|---|---|---|---|---|
| | | වටිනාකම | වටිනාකම | වටිනාකම |
| 1 | අඹ ලෑලි වර්ග අඩි 1 (පළල 6") | 175.00 | 85.00 | 80.00 |
| 2 | සවරිනුගලෑලි 2*2 - 1' | 47.50 | 48.00 | 45.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති තරිඳු ලී මෝල සහ ලී වෙළඳ සැල, වැලිගොඩවත්ත, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 14 දැවමය භාණ්ඩ මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| අනු අංකය | විස්තරය | Samagi Furnishers | | Seetha Holdings (Pvt) Ltd | |
|---|---|---|---|---|---|
| | | වර්ගය | වටිනාකම | වර්ගය | වටිනාකම |
| 1 | පොත් රාක්ක උස 6' පළල 2 2/1' | මැලමයින් | 25,750.00 | BR 20 | 32,990.00 |
| 2 | මේස දිග 6' පළල 3' | තේක්ක | 47,500.00 | Wood | 62,990.00 |
| 3 | මේසය ( දැවමය ) දිග 8' පළල 3' | තේක්ක | 62,500.00 | Wood | 89,990.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති සමගි ෆර්නිචර්ස්, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 15 ක්‍රීඩා උපකරණ මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| අනු අංකය | විස්තරය | Champa Stores, Dalada Weediya, Kandy | | Sri Lanka Stores, Nawalapitiya | |
|---|---|---|---|---|---|
| | | වර්ගය | වටිනාකම | වර්ගය | වටිනාකම |
| 1 | වොලි බෝල් 1 | Mikasa Q1 | 10,960.00 | | 11,200.00 |
| 2 | නෙට් බෝල් 1 | Mikasa Q1 | 4,960.00 | | 5,300.00 |
| 3 | වොලි බෝල් නෙට් එක | China | 3,960.00 | | 4,800.00 |
| 4 | නෙට් බෝල් නෙට් එක | | 790.00 | | 4,300.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති චම්පා ස්ටෝර්ස්, දළදා වීදිය, මහනුවර යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 16 වීථි ලාම්පු සඳහා මිල ගණන් කැඳවීම.

| අනු අංකය | විස්තරය | Nawalapitiya Electrical | | ATLASELECTRICALS | Sanuka Electrical | Priya Stores | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ගය | වටිනාකම | වටිනාකම | වටිනාකම | වර්ගය | වටිනාකම |
| 1 | තනි ස්විචය | orange | 375.00 | | 425.00 | | |
| 2 | 3/4 කන්ඩියුට් බට | | 390.00 | | 430.00 | | |
| 3 | 12.5 w LED විදුලි බුබුළු | orange | 1,705.00 | | 1,775.00 | | |
| 4 | තනි සන්ක්බොක්ස් | | 135.00 | | 140.00 | | |
| 5 | 1044 වයර් 20 m | orange | 1,800.00 | | 1,900.00 | | |
| 6 | G.I. පයිප්ප කවරය | | 1,975.00 | | 2,125.00 | | |
| 7 | Bracket | | 725.00 | | 800.00 | | |
| 8 | 25 w LED | | | 2,590.00 | | Everton | 4,750.00 |
| 9 | 30 w LED | | | 3,090.00 | | | |
| 10 | 50 w LED | | | | | Everton | 5,450.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 17 ජල නල ගබඩාව සදහා උපාංග මිලදී ගැනීමට මිල ගණන් කැදවීම.

| අනු අංකය | විස්තරය | Keshawa Hardware | | Mahanuwara Agencies | | Mahaweli Hardware | | New Lanka Hardware | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | වර්ගය | වටිනාකම | වර්ගය | වටිනාකම | වර්ගය | වටිනාකම | වර්ගය | වටිනාකම |
| 1 | 20 mm PVC PIPE | Slon | 675.00 | Slon | 685.00 | Slon | 850.00 | PVC | 885.00 |
| 2 | 90mm PVC PIPE | Slon | 26,350.00 | Slon T 1000 | 26,500.00 | Slon | 2,560.50 | PVC | 2,695.00 |
| 3 | 110mm PVC PIPE | Slon | 33,350.00 | Slon T 1000 | 33,500.00 | Slon | 6,127.50 | PVC | 6,450.00 |
| 4 | SOLVENT CEMENT | | | 500g | 3,170.00 | | 3,500.00 | 500g | 3,825.00 |
| 5 | HAKSOW BLADE | | | PE + Slon | 325.00 | | | | |
| 6 | 63mm VALVE SOCKET | | | Slon | 416.50 | | 441.00 | | 490.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා අයිතම 1, 2 හා 3 සදහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත මිලදී ගැනීමටත් අයිතම අංක 4, 5 හා 6 සදහා අවම මිල ගණන් සපයා ඇති මහනුවර ඒජන්සීස්, මහනුවර යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 18 කැනපි හට් මිලදී ගැනීමට මිල ගණන් කැදවීම.

| අනු අංකය | විස්තරය | Tent Master | Rasika Tents | Eco events (Pvt) Ltd |
|---|---|---|---|---|
| | | වටිනාකම | වටිනාකම | වටිනාකම |
| 1 | 10' x 10' GI Pipe Tent 1 | 58,000.00 | 67,000.00 | 62,000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති Tent Master, Katubedda, Moratuwa යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 19 වරිපනම් බදු හා බදු කුලී ලේඛන මිලදී ගැනීමට මිල ගණන් කැදවීම.

| අනු අංකය | විස්තරය | Thilina Printers | Rajah Press |
|---|---|---|---|
| | | වටිනාකම | වටිනාකම |
| 1 | වරිපනම් හා බදු කුලි ලේඛණ | 4,000.00 | 4,400.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති Thilina Printers, No 03, Market, Gelioya යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 20 ගොඩනැඟිලි ද්‍රව්‍ය මිලදී ගැනීමට මිල ගණන් කැදවීම.

| අනු අංකය | විස්තරය | Keshawa Hardware | නෙත්මල් ට්‍රේඩර්ස් |
|---|---|---|---|
| | | වටිනාකම | වටිනාකම |
| 1 | සිමෙන්ති | 3,050.00 | 2,950.00 |
| 2 | වැලි | 16,500.00 - 22,500.00 | 18,500.00 |
| 3 | මැටල් | 10,000.00 | 15,000.00 |
| 4 | කම්බි 10 mm | 1,600.00 - 1,800.00 | 1,625.00 - 1,800.00 |
| | 12mm | 1,800.00 - 2,800.00 | 1,800.00 - 2,700.00 |
| | 16mm | 3,200.00 - 4,900.00 | 3,200.00 - 4,095.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 21 PF – 7405 කැබ් රථය අලුත්වැඩියාවට මිල ගණන් කැදවීම.

| අංකය | විස්තරය | ඒකක ගණන | Rainbow Motors | Sampath Motors | Nawalapitiya Auto Care |
|---|---|---|---|---|---|
| 1 | Genuine Cut Bush | 2 | 15,800.00 | 16,400.00 | 13,640.00 |
| 2 | Genuine Link Rod | 2 | 69,800.00 | 73,800.00 | 61,600.00 |
| 3 | Genuine Rack End | 2 | 76,000.00 | 78,000.00 | 69,200.00 |
| 4 | Genuine AC Belt Adjuster Racer | 1 | 12,800.00 | 7,400.00 | 4,400.00 |
| 5 | Genuine CV Assy | 1 | 39,000.00 | 38,500.00 | 34,700.00 |
| 6 | Genuine CV Inner Boot | 2 | 12,700.00 | 10,700.00 | 9,700.00 |
| 7 | Genuine Universal joint | 1 | 9,000.00 | 9,500.00 | 6,240.00 |
| 8 | Genuine Tie Rod Set | 2 | 52,000.00 | 42,000.00 | 41,180.00 |
| 9 | Master Switch | 1 | 38,000.00 | 36,800.00 | 32,500.00 |
| 10 | Caliper Pin Cutting & Filling Charges | 1 | 10,800.00 | 10,800.00 | 8,500.00 |
| 11 | Winder Motor | 1 | 26,000.00 | 24,000.00 | 22,500.00 |
| 12 | CV Grease | 4 | 3,600.00 | 3,800.00 | 3,000.00 |
| 13 | Brake Oil Dot3 500ml | 1 | 3,100.00 | 2,800.00 | 2,200.00 |
| 14 | Genuine Front Brake Pad Set | 1 | 36,000.00 | 34,000.00 | 32,000.00 |
| 15 | Radiator Cleaning Charges for | 1 | 5,900.00 | 7,600.00 | 4,000.00 |
| 16 | Fan Jell Tube | 6 | 4,200.00 | 3,600.00 | 2,250.00 |
| 17 | Radiator Coolant | 2L | 4,900.00 | 4,800.00 | 3,000.00 |
| 18 | Radiator Cap | 1 | 3,100.00 | 3,800.00 | 2,100.00 |
| 19 | Repair Charges for | | 58,000.00 | 65,000.00 | 48,500.00 |
| | Total | | 480,700.00 | 473,300.00 | 401,210.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

8 – 22 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සදහා A 4 මිලදී ගැනීම සඳහා මිල ගණන් කැදවීම.

| අනු අංකය | විස්තරය | ශ්‍රී ශෛරීස් | ශ්‍රී ලංකා ස්ටෝර්ස් | කාන්ති ස්ටෝර්ස් නාවලපිටිය | නදීකාස් නාවලපිටිය |
|---|---|---|---|---|---|
| 1 | A4 70 GSM | 2,900.00 | 2,250.00 | 2,325.00 | |
| 2 | A4 75 GSM | 2,600.00 | 2,500.00 | 2,625.00 | |
| 3 | A4 80 GSM | 2,400.00 | 2,750.00 | 2,800.00 | 2,300.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා A4 80 GSM සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නදීකාස්, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>09. වෙනත් කරුණු</u>**

සාකච්ඡා කිරීමට වෙනත් කරුණු නොවූ බැවින් ගරු සභාපතිතුමා පැමිණ සිටි පිරිසට ස්තුතිය පළ කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 1.45 ට පමණ අවසන් කරන ලදී.

සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය</u>
සභාපතිතුමනි, ගලබඩ දිය ඇල්ලේ දාලා තියෙන්නේ දේශීය වැඩිහිටි රු. 100.00 ළමා රු. 50.00 අය කරන්නේ. අපි එදා

ගියා.අපි ලේකම් මිස්ටත් කථා කරා. එදා ඩියුටි කවුරුත් ඇත්තෙත් නෑ. 600 කට එහා පිරිසක් ගිහිල්ලා හිටියා. ඊට පස්සේ දැනුම් දුන්නට පස්සේ එදා ඩියුටි ඉඳලා තියෙන්නේ ළහිරු. නමුත් ළහිරු කෝල් කරලා අර ළඟ ඉන්න අනිත් එක්කෙනා තමයි ආවේ. ටිකට් කඩන්න කෙනෙකුත් නෑ. එතන ආච්චි කෙනෙක් ඉඳලා යන අයගෙන් සල්ලි ගන්නවා. ඊට පස්සේ ප්‍රශ්න කරාම ආච්චි දිව්වා. 600 ක් විතර යනවා කියන්නේ එදා ටිකට් ගත්තේ නැති එක කොච්චර පාඩුවක්ද සභාවට ? කිසි කෙනෙක් නෑ වගකීමක් දරන කෙනෙක්. ඒ නිසා ඒ ගැන ඊට වඩා අවධානය යොමු කරන්න වෙනවා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
දැනට රු. 100.00 ක් ගන්නවද?

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
100 ක් කියලා දාලා තියනවා. අපි සල්ලි දුන්නා. මගේ ළඟ ටිකට් එක තියනවා. මට අද ගේන්න අමතක උනා. මම ටිකටුත් ගත්තා. අපි ගියා එතන එතන රු 100.00 යි ළමා 50.00 යි. ළමයින්ටයි ඔක්කොටමයි අපි ගිය ඔක්කෝටම රු 100.00 ටිකට් ගත්තේ. දේශීය වැඩිහිටි 100 ක් තමා තියෙන්නේ. මම අද කියන්න සටහන් කරගෙන ආවා කඩන ටිකට් එක රු 100.00 යි 100 ටිකට් එකක් දෙන්නේ. අපි 4 ට තව සෙට් එකක් ගියා. බලනකොට ටිකට් පොතේ ටිකට් නෑ. එතකොට ටිකට් ගෙනල්ලා යනවා කියන්නේ තව අපිට පාඩුවක්. සභාවට එන සල්ලි බොහෝ දෙයක් නෑ මෙහේ 50 කියලා ගෙවනවා 100 ක් ගන්නවා. බාගෙට බාගයක් කඩන ටිකට් නෑ. ඩියුටි ඉන්න කෙනත් නෑ. ටිකට් පොත් ටිකවත් ගිහිල්ලා තියාගෙන නෑ. අර කාටදෝ දීලා ඒ මිනිස්සු සල්ලි අරන් යනවා. මීට වඩා අපි ගිය සභාවේ ගලබඩ දිය ඇල්ල ගැන ආදායම් ගැන ගොඩක් කථා කළා. ඒ නිසා මම හිතනවා මීට වඩා අවධානය යොමු කරලා අපි ඒ ගැන වැඩ කරොත් හොඳයි කියලා. ළහිරුට එන්න දුර වැඩි නිසා ළහිරු අනිත් එක්කෙනාට කෝල් කරාම ළඟ ඉන්න එයා ඇවිල්ලා අපි කථා කරාම එයා බය උනා. මම කිව්වා බය වෙන්න දෙයක් නෙවෙයි ඔයගොල්ලන්ගේ ඩියුටිය හරියට කරන්න. ඊළඟට ටිකට් කඩන්න. ටිකට් 3 යි තියෙන්නේ. තව 15 ක් 20 ක් යනවා. ටිකට් කඩන්න මේගොල්ලෝ මොනවද මේ ඩියුටි කියලා කරන්නේ? සභාවේ ආදායම සම්පූර්ණයෙන්ම නැති කරලා තියෙන්නේ. 600 ක් 700 ක් ගියා කියන්නේ ටිකට් එකක්වත් කැඩුවේ නෑ කියනවනේ මම කථා කරලා කියලා තමා ටිකට් ටික ඉල්ලුවේ. ටිකට් ටික මම ගත්තේ. මම ලබන සභාවට ටිකට් ටික ගෙනල්ලා දෙන්නම්. මම තියන් ඉන්නවා ඒවා ඔප්පු කරන්න ඕනි නිසා. ෆෝන් එක අවුල් වෙච්ච නිසා ප්‍රශ්නයක්. 100 කියලා ප්‍රින්ට් කරලා තියෙන්නේ. ටිකට් කඩන්න කවුරුත් නැති උනාම අර ආච්චි රු. 100 100 ඉල්ලනවා. මම දෙමළෙන් කථා කරාම ආච්චි නැගිටලා දුවනවා. මම ඇහුවා ඔයා කොහොමද ගන්නේ කියලා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ඔය කියන කථාව වෙන්න පුළුවන්. මොකද ඔය කිව්වට හැමදාම යනවද දන් නෑ. මෙහෙන් යනවා යනවා කියලා. බලන්න කෙනෙක් නෑ. එයා දවසකට කැඩෙන ටිකට් ගාන දන් නෑ. ඒ නිසා ඒ ටිකට් පොත් ටික අරන් යන් නෑ. සම්පූර්ණ වගකීම පැහැර හැරලා තියෙන්නේ.

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
එතකොට සභාපතිතුමා, අපි එදා ඒ හිටපු අර අනිත් එක්කෙනාට මට නම මතක නෑ. එයාට මම කිව්වා ඔයාලා කොහොමද මේක ඔප්පු කරන්නේ කියලා. මොනවද ඔයාලා ළඟ තියන ඩොකියුමන්ට් කියලා කිසිම කිසි දෙයක් නෑ. මම කිව්වා ඔයා ඔයාගේ රාජකාරිය හරියට කරනවානම් දවසට මේ අංකෙන් අද පටන් ගන්නේ 101 න් නම් අද 200 වෙනකම් කැඩුවා ඒක ඔයාලා නෝට් එකක් දාගන්න පොතක් තියලා. කඩපු ටික ලියාගන්න ඔයා වැඩ කරපු එකේ ආදායම් දාන්න. මේවා මුකුත් දන් නැතුව සභාවට කොහොමද සල්ලි යන්නේ? අපි දන් නෑ මොනවද කියලා ඒ ගැන ඔයාලට වගකීමක් තියනවා. අද ඩියුටි කරාම අද පටන් ගන්නේ මේ අංකෙන් ටිකට් කඩන්න හවස් වෙනකොටමේකෙන් ඉවර කරා. එතකොට ටිකට් පොත් ඉවර වෙනවා දන්නවානම් සභාවට ගිහිල්ලා ටිකට් පොත් ටික ගෙනල්ලා තියා ගන්න ඕනි ඒක කරලත් නෑ. ඩියුටිය පැහැර හැරලා එදා. රාජකාරියේ ඉන්නවා ළහිරු ගෙදර. බය වෙච්ච පාර තමා මම හිතන්නේ ලේකම් මිස් දන්නවා ලේකම් මිස්ට කථා කරලා අපි ඇහුවා කවුද වැඩ කරන්නේ කියලා. ඊට පස්සේ තමයි ළහිරු අනිත් එක්කෙනාට කියලා. එයා කියනවා ළහිරු තමයි අද වැඩ කරන්නේ කියලා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ඔබතුමියට රු. 100.00 ටිකට් එකක් දුන්නද?

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
ඔව් මම ඒක ගෙනල්ලා දෙන්නම්. මම ඒක තියන් ඉන්නේ. එතන බෝඩ් එකේ ගහලා තියෙන්නේ එහෙම. ඒකත් ෆොටෝ ගහලා තියෙන්නේ. හරිම අපිරිසිදුයි යන්න බෑ. පුදුම අපිරිසිදුයි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
මන්ත්‍රීතුමිය මේ අලුතෙන් අච්චු ගහපු ටිකට් පොත් මේකේ ටිකට් එක රු. 50.00 යි දේශීය වැඩැහිටි. මන්ත්‍රීතුමිය ළඟ රු. 100.00 ටිකට් එකක් ආවා කියන්නේ ඒක අදම බලන්න ඕනි.

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
කවුරුත් කියපු එකක් නෙවෙයි මම ලබපු අත්දැකීමනේ සභාපතිතුමා. එතන ඉඳලා තමයි ඒ වැඩ කරේ. අපි කථා කරා. ශිරෝමි මන්ත්‍රීතුමියයි මමයි තමා ගියේ. තව කණ්ඩායමක් ගියා. ඔබතුමා හොයන්න ළහිරු සඳුදා වැඩ කරාද නැද්ද කියලා එතකොට හොයා ගන්න පුළුවන්.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ඔබතුමියගේ details ටික ගෙනත් දෙන්න. එතකොට සාක්ෂි ඇතුව කථා කරමු. ටිකට් එකයි ෆොටෝ එකයි එක්ක කථා කරමු. සභාව ඉවරවෙලා වාහනයක් යවලා චන්ද්‍රිකා මන්ත්‍රීතුමිය ගිහිල්ලා ගෙනත් පෙන්නන්න. ඒක බලන්නම ඕනි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
සභා ගොඩනැඟිල්ලේ ඉහළ මහල කුලියට දීමේදී රැස්වීම්, දේශන, අධ්‍යාපන වැඩමුළු, පුහුණු වැඩමුළු, ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ, සමිති සමාගම්වල රැසවීම්වලට දෙමු. Function එකක් තියනවානම් අපේ කෙනෙක් භාරකාරයෙක් හිටියට තියන්න ඕනි. එයා තමයි A/C operate කරන්න වෙන්නේ.

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
කාර්යාල මට්ටමින් ඔක්කොම උනා. අපිත් හිතුවේ නැති මට්ටමේ සෙනඟක් එතනට ආවා. ඒ නිසයි A/C එකේ ප්‍රශ්නේ ආවේ. මට පොඩ්ඩක් ඒක ඉල්ලගන්න බැරි උනා. ඔක්කොම හරි කියලා බට්ටා කියලා කථා කරන්න කිව්වේ එයා ඔක්කොම හදලා දුන්නා. මම එයාට ගෞරව කරනවා ස්තූති කරනවා. ලේකම්තුමියයි කාර්යාලයේ හැමෝම ලබා දුන්න සහයෝගයට. මම කිව්වෙත් ඉදිරියේදිත් සියල්ල එක්ක දෙන්න කථා කරන්න අපහසුතාවයක් එන් නෑ. ජනෙල් ඇරියත් කර්ටන් තියන නිසා තමයි අපහසුතාවය ආවේ. ජනෙල් වලින් හුලං ආවනම් ඇතුලේ රශ්නයක් දැනෙන් නෑ. A/C එක්ක තිබ්බානම් සර්ව සම්පූර්ණයි. නැත්තම් වෙන මුකුත් අවුලක් නෑ. ඒකට ස්තූතිවන්ත වෙනවා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
දංගොල්ල ප්‍රශ්නය මේ අනුව ප්ලෑන් එකක් තියනවා ඒකේ ස්ථාන හරියට හඳුනාගන්න බැරි ගැටළුවක් තියනවා. ඒ නිසා අපි මිනින්දෝරු මහත්තයට කියලා නැවත වතාවක් ඒ ස්ථාන ලකුණු කරගෙන කොහොමහරි මේ ගැටළුව විසඳමු.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
සභාවෙන් අපි දිනයක් දාලා සභාවේ කම්කරුවන් යොදවලා පාර සුද්ධ කරන්න පරිසර මහතා කටයුතු කරන්න සූදානම් කරාට පස්සේ ගාමිණී සමරතුංග මහතා විරෝධය ප්‍රකාශ කරපු නිසා තමයි ආපසු ඇවිත් තියෙන්නේ. අපේ පැත්තෙනුත් යම් කිසි අඩුපාඩුකම් සිද්ධ වෙලා තියනවා. මාර්ගය මැනලා නිරවුල් කරලා සලකුණු කරාට පස්සේ මං දන් නෑ අපේ නිලධාරි මහත්මයෙක් ගිහිල්ලා මායිම් බලා ගත්තද නැද්ද කියලා. නමුත් ඒ මායිම් සලකුණු වෙලා නෑ. සලකුණු කරලා ඒ දෙපාර්ශ්වය දැනුවත් කරලා තිබුණානම් ඒ ගැටළුව එන් නෑ. නමුත් දැන් නැවතත් ලේකම්තුමිය මිනින්දෝරු මහත්මයාව දැනුවත් කරලා දැන් මාසෙකට වැඩියි. මේවා කල් අරින්න ගියොත් වැඩිපුර ගැටළුවක් වෙනවා. කමිටුවලදී අපි අපහසුතාවයට පත් වෙනවා. ඒක නිසා අද හෙටම තීරණයක් අරගෙන මිනින්දෝරු මහත්තයාට දැනුම් දීලා තාක්ෂණ නිලධාරි, පරිසර නිලධාරි යවලා ඒ මාර්ගය නිරවුල් කර ගත්තා නම් දවසින් ඒ ගැටළුව නිරාකරණය කර ගන්න පුළුවන්.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
පසුගිය දවසක ගහක් කපන්න ගිහිල්ලා බලන්තොට සුනිල් වික්‍රමසිංහ මහතාගේ ගෙදරට ගහක් කඩන් වැටිලා. එයාලගේ අනතුර සම්බන්ධව මෙහෙට දන්වලා මෙහෙට ලිපි ගනුදෙනු වෙලා තමයි වැඩේ කෙරිලා තියෙන්නේ. ගහ කපන අය අතින් වැරදීමක් වෙලා තමයි ගහ වැටිලා තියෙන්නේ. ලොකු අලාභයක්. ඒ අය අවසානෙට පැමිණිල්ලක් දාලා වත්ත අයිති සමඟි මුදලාලි ගිහිල්ලා එකඟ වෙලා තියනවා. ඒ එකඟ වීම තුළ එයා අතින් වැඩේ වෙන් නැතිවෙයි කියලා මුදලක් දෙන්න තමයි එකඟ වෙලා තියෙන්නේ. මේකට සභාවෙන් මැදිහත් වීමක් වෙලා පිළිසරණක් වෙන්න පුළුවන්නම් එයාලා ඒ දේ බලාපොරොත්තු වෙනවා. තාවකාලිකව වහන්න පිළියමක් යොදනවා නම් හොඳයි. තව ගස් 2 ක් තියනවා. අවධානම් ගස්. අනිත් ගස් දෙකත් කපන්න අවධානය යොමු කරමු. සභාපතිතුමා පොඩි ටාපෝලින් කෑල්ලක් ඕනි. එකක් දාලා තියනවා ඒක ඔරොත්තු දෙන් නෑ. අධ්‍යාපනය ලබන දරුවෝ දෙන්නෙක් ඉන්නේ ගෙදර දැන් ඉන්න තත්වය අනුව එයාලට මොනවත් කරගන්නත් බෑ.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
දිග පළල බලලා ඇණවුම් කරලා අරන් දෙමු.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
නාගස්තැන්න පාර සම්බන්ධව ශුද්ධ පවිත්‍ර කරන්න දාගත්තා. නාගස්තැන්න වත්ත සහ ගලමුදුන කණුව කට්ටියක් එක්ක එකතු කරලා ශ්‍රමදානයක් දාගන්න පුළුවන්. JCB යන්ත්‍රය අවශ්‍යම වෙනවා. එහෙම වුනොත් දිනයක් අපි කථා කරලා කරන්න ඕනි. දැනටත් කඩා ගෙන ගිහිල්ලා තියෙන්නේ කාපට් එක.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ප්‍රිමික්ස් ගන්න තැනක් නෑ. PRD එකෙනුත් කථා කරලා ඇහුවා ප්‍රිමික්ස් ගන්න පුළුවන්ද කියලා ගන්න විධියක් නෑ.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
නෙල්නා සමාගමට අක්කර 700 ක් දෙන්න ලෑස්ති වෙලා තියනවානේ LRC එකෙන්. දිය උල්පතක් තියනවා බලන්තොට උතුරට වතුර ගන්න. උඩ තේ වගා කරලා තියෙන්නේ. දිය උල්පතටත් අරකට දාන පොහොර ටික තමා පල්ලෙහාට එන්නේ. ඒවගේ අඩුම ගානේ පානීය ජලය ගන්න තැන්වලවත් ඉහළ කොටස ආරක්ෂා කරන විධියට LRC එකෙන් ඉඩම් බෙදා දීමක් කරන්න කියලා දැනුවත් කරොත් හොඳයි. මීට පස්සේවත් එහෙම දේවල් කරනකොට පොඩි සංවේදීතාවයක් තිබුණොත් හොඳයි. ස්වාභාවික වතුර ටික ආරක්ෂා වෙලා විධියට LRC එකට දැනුවත් කිරීමක් කරොත් හොඳයි ඉඩම් කට්ටි කරන්න කියලා.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
සුනිල් මහත්මාගේ නිවසට අලාභහානි වෙලා. සභාව මඟින් සමඟි මුදලාලිට දැනුම්දීමක් කරලා තියනවා ඒත් ගනන් අරන් නෑ. ගස් කපන අය ඉද්දි රු. 20,000.00 ක් ඉල්ලලා. ඒක දෙන්න බැරි කමට දෙන්නෙක් ගෙනත් කපලා. ගෙයින් පැත්තක් සම්පූර්ණයෙන් පොඩි වෙලා. TV, පුටු සෙට්, ළමයින්ගේ පොත් පවා විනාශ වෙලා. වහලේ උඩට වැටුණු නිසා ඉතිරි කොටසෙත් වහලය කැඩිලා. වියදම තක්සේරු කරොත් ලක්ෂ 30 ක් 40 ක් යනවා. ලක්ෂ 8 ක ඇස්තමේන්තුවක් සකස් කරලා තියනවා. සභාවට දැනුම් දීමක් කරලා තියනවා. සභාව මැදිහත් වෙලා සාධාරණයක් කරලා දෙන්න වෙනවා සභාපතිතුමනි. විශ්‍රාම ගිය හමුදා නිලධාරියෙක් නිසා එයාට ඉදි කරගන්න විධියක් නෑ. පොලිසියේදී සාධාරණයක් වෙලත් නෑ. සභාවේ කාර්මික නිලධාරි මහත්මයෙක් මඟින් ඇස්තමේන්තුවක් හදලා වැඩපිළිවෙලක් කරොත් හොඳයි කියලා මම මේ වෙලාවේ මතක් කරනවා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ඇස්තමේන්තුවක් හදලා දෙමු.

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා
වත්තේ ඊයේ හවස 4.30 ට මැරිලා අද උදේ 9.00 වෙනතුරු ඩොක්ටර් ඇවිත් බලලා නෑ. පළාතටම ඉන්නේ ඩොක්ටර් එක්කෙනයි.මරණ 3 ක් 4 ක් බලන්න නෑ. වත්තේ මිනිස්සු ටික අනාථ වෙලා ඉන්නේ. සභාවේ මේවා කථා කරන්නේ පත්තර වාර්තාකරුවන් කවුරුත් එන් නෑ. මේවා හෙළි කරන් නෑ. අද උදේ 9.30 ට තමයි ඩොක්ටර් ආවේ. ඊට පස්සේ තමයි ඉතුරු වැඩ කළේ.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ගමේ ග්‍රාම සේවක නෙමෙයිද මරණ සහතික දෙන්නේ?

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා
ප්‍රයිවට් වතුවල ඩොක්ටර්ස්ලා ඉන්න නිසා ඩොක්ටර් බලන්න ඕනි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
හොඳම දේ තමයි මන්ත්‍රීතුමා ග්‍රාම සේවකට ගිහින් වාර්තාව දෙන්න පුළුවන් විධියට හදන එක. මේ ගැන ප්‍රාදේශීය ලේකම්තුමාට අපි කථා කරලා ඒ වැඩේ කරමු.

ගරු මන්ත්‍රී එන්.එම් සුසිලා දමයන්ති මිය
ගරු සභාපතිතුමනි, කොට්ඨාශේ ඉන්නවා වෘත්තීය පුහුණු හොඳට ලබපු අය ඒ වුණාට ඒ අයට කිසිම සහතිකයක් නෑ. එහෙම අයට මොකක් හරි සහතිකයක් ඒ අයගේ සුදුසුකම් අනුව ලබා දෙනවානම් හොඳයි කියලා මම හිතනවා. තරුණ තරුණියෝ ඉන්නවා රට යාමේ බලාපොරොත්තුවෙන් එයාලට අවශ්‍ය වෘත්තීය පුහුණුව ලබා ගන්න. දැනට තියන ආර්ථික අපහසුතාවයත් එක්ක ටිකක් අමාරුයි මුදලින් බාගයක්වත් ගෙවලා පුහුණුවක් ලබා දෙන්න පුළුවන්නම් ලොකු දෙයක්.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
මොන භාෂාවෙන්ද?

ගරු මන්ත්‍රී එන්.එම් සුසිලා දමයන්ති මිය
ජපන්, කොරියන් ඒ වගේ

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
උලපනේ උගන්නනවා. මාස 6 කට තමා. භාෂාවක් ඉගෙන ගන්නේ භාවිතා නොකර ඉන්නවානම් අමතක වෙනවනේ. ඒ නිසා NVQ Certificate එක දෙනවා. මාස 6 කට Valid.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
මන්ත්‍රීතුමිය එහෙනම් මෙහෙම කරන්න. පෞද්ගලිකව ඒකේ තොරතුරු ටික දෙන්න. මම හොයලා බලලා මොකක්ද උනේ කියලා මම හොයලා කියන්නම්.

ගරු මන්ත්‍රී එන්.එම් සුසිලා දමයන්ති මිය
ගම්පල ඉන්නවා වෘත්තීය පුහුණු හොඳට දන්න අය ඉන්නවා සහතිකය නෑ. ඒගොල්ලන්ට exam එකක් තියලා හරි සහතිකයක් දෙනවානම් පුහුණුවට අනුව ඒක ලොකු දෙයක්. වරකාවේ පුස්තකාලය තියෙන්නේ කන්දක. පොඩි ප්‍රමාණයක් තමයි ඒකෙන් ප්‍රයෝජනය ගන්නේ. පුළුවන්නම් ඒක ගම මැදට ගෙනත් දෙනවානම්. වරකාව කියන්නේ ලොකු ගමක්. ඒකත් පොඩ්ඩක් හොයලා බලනවානම් හොඳයි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

අපිට ඒක ගලවන්න බෑනේ. අපි තව එකක් දාමු. මාසය තුළ වැඩිම පොත් පාවිච්චි කරලා තියෙන්නේ වරකාවේ.

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>
සභාපතිතුමනි, පසුගිය සභා වාරයේදී වැවේගම වතුර ප්‍රශ්නය බලන්න ඔබතුමා මැදිහත් වෙනවා කියලා කිව්වා. අපි පාරිභෝගිකයින් දැනුවත් කරා ඔබතුමා එයි කියලා. ගියවර සභා වාරයේදී යෝජනා කරා දිනයක් ඔබතුමා දුන්නා. අපිට බැරි උනා කරගන්න. මම හිතන්නේ ලබන සතියේවත් ඒක කරගන්න පුළුවන්නම් ඒ ටික කරමු. ඒ වගේම සභාපතිතුමනි, පසුගිය දින කීපයේදී පැවති අධික වර්ෂාවත් එක්ක පවුල් 50 කට ආසන්න ප්‍රමාණයක් නාන ගල්පොත්ත පිහිල්ල පොදු පිහිල්ල ඒක තමයි ඒ පැත්තටම තියන පිහිල්ල. ඒක කඩාගෙන ගිහිල්ලා තියනවා බට ටිකත් එක්ක. ඒක පිළිසකර කරලා දෙන්න කියලා පාරිභෝගිකයෙක් දාලා තිබ්බා facebook එකේ. ඒ සම්බන්ධව බලධාරින් මැදිහත් වෙලා මේකට කවුරු හරි උදව් කරන්න කියලා. අපිටත් කථා කරලා තිබ්බා. අපිත් ඊට පස්සේ කිව්වා කරන්නම් කියලා. හැබැයි අපේ මන්ත්‍රීතුමිය කණගාටුදායක ප්‍රකාශයක් දාලා තිබ්බා ඒකෙදි. එතුමා අහලා තිබ්බා ප්‍රාදේශීය සභාවට මැදිහත් වෙලා මේ දේවල් කරන්න බැරිද කියලා. ඊට පස්සේ ශිරෝමි මන්ත්‍රීතුමිය දාලා තියනවා "අනේ උන්ට කියලා වැඩක් නෑ. උන් ඔක්කොම හොරු" කියලා. ඒ කියන්නේ ප්‍රාදේශීය සභාවේ සියල්ලෝම හොරු කියලා තමයි එතුමිය දාලා තියෙන්නේ. ඒ කියන්නේ ප්‍රාදේශීය සභාව හරහා කරලා දෙන්න කියලා තමයි එතුමා ඉල්ලලා තියෙන්නේ. ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීතුමන්ලා ලේකම්තුමිය ඇතුළු සියළු දෙනාම හොරු කියලා හිතාගෙන තමයි එතුමිය හඳුන්වලා තියෙන්නේ. මම ඒක දැඩි ලෙස පිළිකුලෙන් හෙලා දකිනවා. ඒ වගේ ප්‍රකාශයක් කිරීම. එතුමිය අපේ ආයතනය අපකීර්තියට පත් කරලා තියනවා. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරලා ප්‍රාදේශීය සභාව මඟින් නඩත්තු කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ඇස්තමේන්තුවක් හදලා වැඩේ කරලා දෙමු.

<u>ගරු මන්ත්‍රී ජී.කේ.පී ෆොන්සේකා මිය</u>
ගරු සභාපතිතුමනි, මාපාකන්ද කාණුවේ වතුර ළිඳට යනවා කියලා සති 2 කට කලින් අපි බලන්න ගියා. ඒගොල්ලෝ කාණුව අපි ගිහිල්ලා ආවට පස්සේ කාණුව ගොඩක් හරවලා ළිඳ පැත්තට. එතකොට පෙරේදා පොඩි වැස්සටත් ලොකු වතුර පාරක් ඇවිත් ළිඳට මඩ වතුර පිරිලා කියලා අහහරුවාදා ආවා ලේකම්තුමිය හම්බවෙන්න. මට එන්න බැරි උනා. සභාවෙන් කවුරු හරි දාලා ඒ වැඩේ කරමු කියලා. පොඩ්ඩක් ඒ ගැන අවධානය යොමු කරලා කරලා දෙන්න.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
අපි දිනයක් දෙන්න ඕනි. අපි දිනයක් දාගෙන යන්න. ලබන සතියේ කරන්න.

<u>ගරු මන්ත්‍රී ජී.කේ.පී ෆොන්සේකා මිය</u>
සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වෙනවා ඉඹුල්පිටිය පාලමේ ලැලි ගහලා අලුත්වැඩියා කටයුතු සිදු කරලා දීම සම්බන්ධව බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය</u>
මම ඉස්සරලා කිව්ව කාරණාව ගැන අවධානය යොමු කරන්න කැමතියි. අපි එදා උත්සවේට රැස්වීම් ශාලාව ගන්න එක ගැන. ඇත්තටම ඒ වෙලාවේ ඊට ඉස්සරලා දවසේ නැත්නම් ඊට ඉස්සරලා දවසේ තමයි ඒකේ තීන්දු තීරණ අරන් තිබුනේ. කුමන පදනමේද මේක දෙන්නේ කොහොමද මුදල් අය කරන්නේ කියලා. සමහරක් අයට ගැටළුවක් වෙලා තියනවා කියලා මට දැනෙනවා කථා බහ කරනකොට එදා අය කරපු එක ගැන. සභාවෙන් අපි රිසිට් එකක් කඩලා ගාන අය කරලා ප්‍රශ්නයක් වෙන්න විදියක් නෑ. අපි මොකක් හරි ස්ථිරතාවයක් ඇතුවනේ ඒ දේ කරලා තියෙන්නේ. අර කිව්වා වගේ ඉස්සරලාම වෙච්ච දේ. එතකොට අපි රිසිට් අරන් තියනවානම් අපි මොනවාහරි තියන criteria වලට අනුව අපි ඒක කඩලා අපි අරන් තියනවානම් ගැටළුවක් වෙන්නේ නෑ. එතකොට ඒ වෙච්ච දේත් එක්ක අත්දැකීම් ලබා ගෙන තමයි ඉදිරි කටයුතු කරන්න යන්නේ. ඒ නිසා ශාලාව ලබා දීලා ඒ පහසුකම් අපිට ලබා දුන්නා. වැඩ කරන සේවකයෙක් හරහා අනිත් කටයුතු කරන්න ලබා දුන්නා. ඒකට මට විශේෂයෙන්ම සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළු දෙනාට විශේෂයෙන්ම ලේකම්තුමිය ඇතුළු සියළු දෙනාට ස්තුතිය පුද කරනවා. ඉදිරියේදී අපිට ඒ හරහා විශාල සේවාවක් ලබා ගන්න පුළුවන් වේවි.